# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,861 — 1969 ජුලි 4 වැනි සිකුරාදා — 1969.7.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු — — — | 1113 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම — — | 1137 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය — — — | 1118 | ආණ්ඩුවේ නොවන දැන්වීම් — — — | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම — — — | 1120 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් — — | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම — — | 1136 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම — — | 1141 |
| බඩු බාහිරාදිය විකිණීම — — — | 1136 | විවිධ දැන්වීම — — — | — |


[සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසට අතිරේකයක් වශයෙන් ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ]

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි.**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඈල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1969 ජූලි 18 වැනි දිනදී ඔහු වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව. (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයට මෙම උපරිම වයස් සීමාව නොයෙදේ.)

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන හෝ උසස් සුදුසුකමක් සහ

(ii) (අ) මි. මී. 16 සහ මි. මී. 35 චිත්‍රපටි නිෂ්පාදනය කිරීම, වාර්තා චිත්‍රපට, ප්‍රවෘත්ති චිත්‍රපට හා කෙටි චිත්‍රපට අධ්‍යක්ෂණය කිරීම ආදී චිත්‍රපට සම්බන්ධ සියලුම කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 8 ක මනා පළපුරුද්දක් තිබිය යුතුය.

(ආ) ඡායාරූප ශිල්පය, සකස් කිරීම, මුද්‍රණය, සංස්කරණය හා ශබ්ද පාලනය ආදී චිත්‍රපට කලාවට අදාල සියලුම කරුණු සම්බන්ධව විශිෂ්ඨ දැනීමක් තිබිය යුතු අතර, චිත්‍රපට නිෂ්පාදනයට අවශ්‍ය උපකරණ පරිපාලනය කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

(ඇ) චිත්‍රපට කලාවට ඇතුළත් ඉහත සඳහන් අංශයන් කීපයක් හෝ එකක් සඳහා පිළිගත් දේශීය හෝ විදේශීය සංවිධාන වලින් පිරිනමන සම්මාන හිමි කරුවෙක් විය යුතුය.

**සටහන.**— ඉහත 4 ඇ (ii) ඡේදයේ දැක්වෙන, සුදුසුකම් තිබේ නම් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන නැතහොත් උසස් අධ්‍යාපනික සුදුසුකම් දරණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන්ද අයදුම්පත් භාරගන්නවා ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වීටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සෑ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතික.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("ආ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් නැතට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ආ" සළකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන්කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කායාීලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම්පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබෙන්නාවූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූනි මස 27 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1,
ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

7–179—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරී තනතුරු

ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරී තනතුරු සඳහා අයදුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

**2. වැටුප් දීමනාවන් හා සේවය පිළිබඳ කොන්දේසි.**—මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 1,980 න් පටන්ගෙන වර්ෂයට රු. 120 සහ 180 බැගින් වැඩිවී රු. 4,620 තෙක් නගී. රජයේ රෙගුලාසි අනුව ජීවන වියදම් හා ගෙවල් කුලී ගෙවනු ලැබේ.

**3. අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—අයදුම්කරුවන් 1969 ජූලි මස 27 වැනි දිනට වයස, අවුරුදු 25 ටත් 35 ටත් අතර ලාංකිකයන් විය යුතුය.

**අයදුම්කරුවෝ :**

(1) (අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සාමාර්ථය ලැබ පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඇත්තවුන් විය යුතුය :—

(ආ) (i) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5 ක පලපුරුද්දක් ඇතිව බිම් මැනීම හා මට්ටම් පිළිබඳව සර්වේයර් ජනරාල්ගේ අවසර පත්‍රය.

(ii) පහත සඳහන් එකක් ඇතුළුවූ ලංකා කාර්මික විද්‍යාලයේ අනුමත කරන ලද පාඨමාලාවක් අයදුම්කරුවන් සම්පූර්ණ කරන ලද බවට සහතිකය :—

(අ) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5 ක පලපුරුද්ද ඇතිව ගොඩනැගිලි තැනීම (i) සහ (ii) හා මට්ටම් ගැනීම (i) හා (ii).

(ආ) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5 ක පලපුරුද්දක් ඇතිව නාගරික හෝ ගොඩනැංවීම් ඉංජිනේරු සහතිකය.

(iii) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳ අවුරුදු 5 ක පලපුරුද්දක් ඇතිව ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂක ශ්‍රේණියට පත්වීමේ දෙපාර්තමේන්තු විභාගයෙන් සාමාර්ථ්‍යය හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථ්‍යය.

**4. සේවය පිළිබඳ කොන්දේසි.**—මෙම පත්වීම අවුරුදු 3 ක පරීක්ෂණාත්මක කාලයකට යටත් ය.

(අ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් තනතුරු වලට පත්කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු අතර, ලංකාවේ කවර පෙදෙසක වුවද සේවය කිරීමට සූදානම් විය යුතුය.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් මෝටර් වාහන සපයා ගත යුතුය. රජයේ මුදල් රෙගුලාසි අනුව ඔවුන්ට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(ඇ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් රු. 2,000 ක ඇපයක් තැබීමට සූදානම් විය යුතුය.

(ඈ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දැනට පනවා ඇති නීති හා මින්මතු පනවන නීති වලටද විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ නීති වලටද තෝරාගනු ලැබූ අපේක්ෂකයින් බැඳී සිටිය යුතුවේ.

5. තම චරිතය පිළිබඳව මෑතකදී ලබා ගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුය.

6. මෙයට යාකර ඇති නියමිත පෝර්මය අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 1969 ජූලි මස 27 දිනට හෝ ඊට පෙර හෝ "ඉඩම් කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ 1" යන ලිපිනයට එවිය යුතුය.

7. අයදුම්පත් ලැබුනු බව දන්වනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මූල පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් වලට අදාල වූද පොදු කොන්දේසි බලන ලෙස ඉල්ලුම් කෙරේ.

කේ. එන්. වීරක්කොඩි,
ඉඩම් කොමසාරිස්.

1969 ජූලි මස 4 දින,
කොළඹ 1,
ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දීය.

## ආකෘති පත්‍රය

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරී තනතුරු**

1. (අ) සම්පූර්ණ නම :————.
(ආ) මූලකුරු සමග නම :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.

4 උප්පත්තියෙන් ලාංකිකයෙක්ද නැතහොත් ලියාපදිංචියෙන් ලාංකිකයෙක්ද යන වග :————.

5. 1969.7.27 දිනට වයස :————.

6. උපන් දිනය හා උපන් ස්ථානය :—
(අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතිකයේ පිටපතක් සමග) :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මීමුත්තාගේ : ————.

7. අධ්‍යාපනික සුදුසුකම් සමර්ථවූ දිනය සහිතව (පිටපත් ඇමිනිය යුතුය) :————.

8. පාසැලින් අස්වූ දින සිට කරන ලද රක්ෂාවල් පිළිබඳ සම්පූර්ණ විස්තර හා දැනට ලැබෙන වේතන සහ වැටුප් ක්‍රමය : ————.

9. ගොඩනැගිලි ඉදිකිරීමේ පලපුරුද්ද :————.

10. යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. අමුනා ඇති සහතිකවල ගණන :————.

12. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමක් ඇත්තවුන් දෙදෙනකුගේ නම්, ලිපිනයන් හා ඔවුන්ගේ තනතුරුත් සමඟ : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැළකිය යුතුයි.**—අයදුම්කරු ලංකාවේ ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) හා (ඈ) දෙකම හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ නොඉපදුනි නම් (අ), (ආ) හෝ (ඇ) හෝ (ඇ) හා (ඈ) දෙකම පිරවිය යුතුය.

7-23—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජුලම්පිටිය කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ උතුරු ගිරුවා පත්තුව කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

ජුලම්පිටිය උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායසීාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායසීාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත්වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායසීාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 අගෝස්තු 21 දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1969 ජූනි මස 18 වෙනි දින,
හම්බන්තොට,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

7-3—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

සංගීත/නාට්‍ය/විචිත්‍රාංග/කථා/ග්‍රාමීය වැඩ සටහන් නිෂ්පාදක/සංවිධායක, සිංහල/දෙමළ/ඉංග්‍රීසි තනතුරු සඳහා වයස 25-45 අතර ලාංකිකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

පහත සඳහන් කරුණු සම්බන්ධව අයදුම්කරුවන් විසින් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ආරම්භක නිර්මාණ ශක්තිය.

(ආ) රචනය, නාට්‍ය ලිවීම හෝ නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ පළපුරුද්ද හෝ සංගීතය පිළිබඳ හසල බව.

(ඇ) සේවාවට අදාල භාෂාව හා තව එක් භාෂාවක් පිළිබඳ විපුල දැනීම.

(ඈ) මනා සාමාන්‍ය දැනීම.

**වැටුප් ක්‍රමය.**—

**නිෂ්පාදක.**—සියළු දීමනා සහිතව මාසික වැටුප රු. 525—රු. 825 (20×5—25×8)

**සංවිධායක.**—සියළු දීමනා සහිතව මාසික වැටුප රු. 625—රු. 900 (25×5—30×5)

තෝරා ගනු ලබන අයදුම්කරුවන් දක්ෂතාවය හා පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් ලක්ෂයක් මත තැබිය හැකිය.

ආරම්භයේ දී පත්වීම් දෙනු ලබන්නේ අවුරුදු 3 ක කොන්ත්‍රාත් කාලසීමාවක් සඳහා වන අතර, ඉන්පසු කොන්ත්‍රාත්තුව වාරිකව දීර්ඝ කළ හැකිය. තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් ස්වකීය වැටුපෙන් 4% ක ප්‍රමාණයක් සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

රජයේ සේවයේ හෝ අනෙකුත් සංස්ථාවල නිලධාරීන්ගේ අයදුම්පත් සැළකිල්ලට භාජනය කරනු ලබනුයේ එම අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන ලද හොත් පමණකි.

තෝරාගනු ලබනු අයදුම්කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත් විශේෂයෙන් වර්ෂ 1956 යේ අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ද ක්‍රියා කළ යුතුය.

මේ සමඟ ඇති ආදර්ශ ආකෘති අනුව සැපයිය යුතු අයදුම්පත් 1969 ජූලි මස 15 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර පෙනෙන පරිදි සංගීත/නාට්‍ය/විචිත්‍රාංග/කථා/ග්‍රාමීය වැඩ සටහන් නිෂ්පාදක/සංවිධායක, සිංහල/දෙමළ/ඉංග්‍රීසි තනතුර යන්න සඳහන් කළ යුතුය.

නෙවිල් ජයවීර,
අධ්‍යක්ෂ-ජනරාල්.

1969 ජූනි මස 24 වැනි දින,
කොළඹ 7.

### ලංකා ගුවන් විදුලි සංස්ථාව

| | |
|---|---|
| සිංහල* | විචිත්‍රාංග* |
| දෙමළ* | කථා* |
| ඉංග්‍රීසි* | ග්‍රාමීය* |
| සංගීත* | නිෂ්පාදක* |
| නාට්‍ය* | සංවිධායක* |

තනතුර සඳහා අයදුම් පතයි

(*අනවශ්‍ය වචන කපා හරින්න.)

1. සම්පූර්ණ නම :————.
මුලකුරු සමග නම සහ ලිපිනය :————.
(මහතා, මහත්මිය හෝ මෙනවිය යන වග සඳහන් කරන්න.)

2. උපන් දිනය සහ ස්ථානය :————.

3. ජාතිය :————.

4. අධ්‍යාපනය සහ ලබා ඇති පුහුණුව :—
අධ්‍යාපනය ලැබූ විද්‍යාල හෝ ආයතන :————.
දිනයන් :————සිට————දක්වා.
සමත් වී ඇති විභාග :————.
කරන ලද වැඩ හා දැරූ වගකීම් සහිත තනතුරු :————.

5. සමත් වී ඇති උසස්ම විභාගය :—
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.
(සහතික පිටපත් අමුණා එවිය යුතුය.)

6. වෘත්තීය සුදුසුකම් :————.
(1) පුවත්පත්, සඟරා හෝ ග්‍රන්ථ සඳහා සපයන ලද ලිපි පිළිබඳ පළපුරුද්ද) (ලියූ මාතෘකා හා ප්‍රකාශනවල නම් කෙටියෙන් සඳහන් කරන්න.) :————.
(2)ගුවන් විදුලියට නාට්‍ය හෝ විචිත්‍රාංග හෝ සැපයීමේ පළපුරුද්ද. (වැඩ සටහන්වල නම් හා ඒවා ප්‍රචාරය වූ දිනයන් සඳහන් කරන්න.) :————.
(3) වේදිකා නාට්‍ය හෝ ගුවන් විදුලි නාට්‍ය හෝ නිෂ්පාදනය කිරීමේ පළපුරුද්ද. (නම් හා දිනයන් සඳහන් කරන්න.) :————.
(4) සංගීතය පිළිබඳ දැනුම :————.
(5) ගොවිපළවල් හා ග්‍රාමීය ජීවිතය පිළිබඳ දැනුම :————.
(මෙය අවශ්‍ය වනුයේ ග්‍රාමීය සේවාව සඳහා පමණකි.)
(6) ඔබට ආරම්භක නිර්මාණ ශක්තියක් ඇතැයි ඔබ සිතන්නෙන් කවර හේතුන් උඩදැයි ලුහුඬින් දක්වන්න :————.
(7) උද්‍යෝගයන් හා විනෝදාංශ :————.

7. පළපුරුද්ද.—කලින් පළපුරුදුකම් සහ කරන ලද රක්ෂා පිළිබඳ විස්තර කාල ක්‍රමානුකූලව :—
ආයතනයේ නම :————.
දැරූ තනතුර :————.
දිනයන් :————සිට————දක්වා.
අස්වීමට හේතුව :————.

8. ඔබේ පෞද්ගලික ජීවිතය පිළිබඳව මනාව දන්නා පුද්ගලයින් තිදෙනෙකුගේ තනතුරු සමග නම් සහ ලිපිනයන් :————.
(1) ————.
(2) ————.
(3) ————.

9. චරිත සහතික පත් ලබාගත් අයගේ නම් සහ තනතුර :————
(1) ————.
(2) ————.
(3) ————.

10. වෙනත් කරුණු :————.

11. මෙම අයදුම් පතෙහි මා විසින් ප්‍රකාශ කොට ඇති කරුණු සත්‍ය හා නිවැරදි ඒවා බවට මෙයින් සහතික කරමි. මා විසින් ඉහතින් ප්‍රකාශ කොට ඇති කරුණු අසත්‍ය හෝ වැරදි බවට තෝරා පත් කිරීමේ දී හෝ ඊට පෙර දී හෙළි වුවහොත් මා මෙම පත්වීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමට පසුව ඒ බව හෙළි වුවහොත් කිසිම වන්දියක් නො ලබා සේවයෙන් පහ කරනු ලැබීමට මා සුදුස්සකු වන බවත් මා වටහා ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-140—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලීය පුරප්පාඩු

මණ්ඩලීය සංවිධානයේ මුදල් හා අභ්‍යන්තර ගණන් පරීක්ෂණ කොට්ඨාශවල 5 වෙනි ශ්‍රේණියේ ගිණුම් හා ගණන් පරීක්ෂණ නිලධාරීන්ගේ තනතුරු සඳහා සලකා බැලීම පිණිස ඉල්ලුම් පත්‍ර එවන මෙන් ලාංකික පුරවැසියන්ට මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. පඩි ක්‍රමය.—(සියලු දීමනාවන් ඇතුලුව) මසකට රු. 600—රු. 40×10—රු. 1,000.

3. සුදුසුකම්.—
(i) වයස.—1969.7.1 වෙනි දිනට අවුරුදු 22-45 අතර විය යුතුයි.
(ii) (ඒ) වරලත් ගණකාධිකාරි විභාගයේ මධ්‍ය පරීක්ෂණයෙන්

හෝ

(බී) පිරිවැය හා කර්මාන්ත ගණකාධිකාරිවරුන්ගේ විභාගයේ I, II හා III වෙනි කොටස් වලින්

හෝ

(සී) ගණක විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා විභාගයෙන්

හෝ

(ඩී) ඊට සමාන විභාගයකින් සමත් වී සිටිය යුතුය.
(ඊ) තවද, රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක ගණකාධිකාරී කටයුතු හදාරණ ලිපිකරුවකු වශයෙන් සේවය කළ යුතු කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුයි. නැතහොත් අඩු වශයෙන් අවුරුදු 5 ක් ගණකාධිකාරී කටයුතු කර තිබිය යුතුයි.

4. (අ) රාජ්‍ය සේවාවේ හෝ පළාත් පාලන සේවාවෙහි සිටින නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ ඒ ඒ දෙපාර්තමේන්තු මගිනි. එම ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලබන්නේ එම දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් 1957 තේ 48 අංකය දරන මෝටර් ගමනාගමන පනතේ 9 වෙනි වගන්තිය අනුව මණ්ඩලය යටතේ සේවය කිරීමට එම නිලධාරීන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි.
(ආ) සංයුක්ත මණ්ඩලවල සිටින්නාවූද, දක්වීම් අනුව සුදුසුකම් ඇත්තාවූද, නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජනය කරන්නේ ඒ නිලධාරීන් දැන් සේවය කරන සංයුක්ත මණ්ඩලයේ සභාපති මහතා හෝ සාමාන්‍යාධිකාරී මහතා ඔවුන් (පත් කිරීමට) තෝරුනොත් තම සේවාවෙන් නිදහස් කිරීමට එකඟ වෙතොත් පමණකි. ඉල්ලුම් පත්‍ර සංයුක්ත මණ්ඩලය මගින් එවිය යුතුයි.

5. සේවා කොන්දේසි.—තෝරා ගනු ලබන අපේක්ෂකයින් 1 වෙනි වතාවට තුන් අවුරුදු පරිවාසන කාලයක් පිට පත් කරනු ලැබේ. ඔවුන් පහත සඳහන් වන කොන්දේසි වලට යටත් විය යුතුයි :—
(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.
(2) දැනටමත් පනවා ඇත්තාවූද, කලින් කල පනවනු ලබන්නාවූද මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදිය යුතුයි.
(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම් වස්, පරිවාසන කාලය තුළදී මණ්ඩලය විසින් නියම කරන ප්‍රමාණයේ සිංහල ප්‍රවීණත්වයක් ලබාගත යුතුයි.
(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් සියයට 10 ක දායක මුදල් ගෙවිය යුතුයි. මණ්ඩලීය දායක මුදල සියයට 15 කි.
(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීමට කැමති යවි යුතුයි.

6. පහත දක්වා ඇති ආදර්ශ පෝර්මය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයේ සිටින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1969යේ ජූලි මස 19 වෙනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාරතැන.

කොළඹ 5, කිරුළ පාරේ
අංක 200 වෙනි ස්ථානයේදිය.

**ලංකා ගමනාගමන මණ්ඩලය**

## ඉල්ලුම් පත්‍ර පෝරමය

1. ඉල්ලන තනතුර :————.

2. ඉල්ලුම්කරුවාගේ සම්පූර්ණ නම :————.

3. ලියුම් ලැබෙන පිළිවෙල :————.

4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිට පතක් අමුණන්න)

5. 1969.7.1 දිනට වයස : අවුරුදු :——, මාස :——, දවස් :——

6. ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද, ලියාපදිංචි වීමෙන්ද යන වග :————.

7. විවාහකද, අවිවාහකද යන බව (විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන් ගණනත් ඔවුන්ගේ වයසත් සඳහන් කරන්න) : ————.

8. ද්විතීය පාඨශාලා අධ්‍යයනය (ඉගෙනීම ලැබූ පාඨශාලාවද, සමත් වූ විභාගයද, දිනයන් සහිතව සඳහන් කරන්න) :————.

9. උසස් අධ්‍යයනය (ඔබ ඉගෙනීම ලැබූ විද්‍යායතන, සාමාර්ථය ලත් විභාග, වෘත්තීය සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දිනයන් සහිතව සඳහන් කරන්න) (සහතික පත්‍ර වල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න) : ————.

10. වෛද්‍ය සුදුසුකම් (ඔබ ඉගෙනීම ලැබූ ආයතන, සමත්වූ විභාග, ලබා ඇති සුදුසුකම් යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර දින යන් සහිතව සඳහන් කරන්න). (සහතික පත්‍රවල මුල් පිටපත් නොව, අනු පිටපත් අමුණන්න) :————.

11. පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. (එනම් දරූ පදවියේ හා සේවා යෝජකයාගේ නම, පත්වූ දිනය, රක්ෂාවෙන් අස්වූ හෝ අස් කළ දිනය, රක්ෂාවෙන් අස්වීමට හේතු යන මේ කරුණු) :————.

12. වෘත්තීය පරිචය හෝ රාජ්‍ය සේවාවේ හෝ පලාත් පාලන සේවාවේ හෝ වෙළඳ ආයතනයක හෝ අන් කිසි ආයතන යක විධායක තනතුරක වැඩ කිරීමේ පළපුරුද්ද පිළිබඳ විස්තර (දරූ තනතුරු, කළ කටයුතු, සියළු දීමනාවන් ඇතුළු වූ පඩි යන මේවා දිනයන් සහිතව සඳහන් කරන්න) :————.

13. මේ තනතුර ඉල්ලීමට තමාට ඇති විශේෂ සුදුසුකම් :——.
   (මේ තනතුරට ඔබේ සුදුසුකම් වැඩි කරවන්නාවූද, යථෝක්ත තනතුරු දරද්දී ඔබ කළාවූද වැඩ පිළිබඳ සංක්ෂේප විස්තරයක් ලියන්න.) :————.

14. සිංහල භාෂාව ඉගෙනගත් ඉහළම ප්‍රමාණය :————.

15. මීට කලින් ඔබ ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් ඉල්ලා ඇත්තේද? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද ? :————.

16. සෙසු විස්තර :————.

17. යම් ක්‍රිමිනල් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියකදී වරදකරු වෙකු වූයේදැයි සඳහන් කරන්න. වරදකරුවෙකු වූයේ නම් විස්තර සඳහන් කරන්න :————.

18. ඔබ ගැන තොරතුරු දත ගැනීමට සුදුසු තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සඳහන් කරන්න :
   1. ————.
   2. ————.

මා විසින් දක්වා ඇති යථෝක්ත තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙහි අඩංගු යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තේරීමට කලින් දැනගතහොත් මා නුසුදුස්සෙකු විය හැකි නියාව හා තෝරා ගැනීමෙන් පසුව දැනගතහොත් වන්දි ගෙවීමක් නැතිව මා සේවාවෙන් පහකර දැමීමට සිදුවිය හැකි නියාව මා දන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුවාගේ අත්සන.

දිනය :————.

7–141—69.7.4.දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**සිංහල ගුරු විභාගය—1969 ඔක්තෝබර්**

ඉහත නම් සඳහන් විභාගය අම්බලන්ගොඩ, අනුරාධපුරය, බදුල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, කොළඹ, දඹුල්ල, දික්වැල්ල, ඇහැළියගොඩ, ගල්ගමුව, ගාල්ල, හෝමාගම, හොරණ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුළියාපිටිය, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නාවලපිටිය, නිකවැරටිය, මීගමුව, නුවරඑළිය, පේදුරුතුඩුව, පොළොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව සහ වේයන්ගොඩ යන මධ්‍යස්ථානයන්හි 1969 ඔක්තෝබර් 14, 15, 16, හා 17 යන දිනයන්හිදී පවත්වනු ලැබේ.

2. මෙම විභාගයට ඉදිරිපත් විය හැක්කේ (ව්‍යවස්ථාවේ 2 වැනි ඡේදයේ සඳහන් පරිදි) ගුරුවරුන්ට පමණි.

3. ආදර්ශ අයදුම්පත්‍රය මේ සමඟ ඇත. එය ඒ ආකෘතිය අනුවම අඟල් 8×13 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිටපත් කර (අයදුම්පත්‍රය) ටයිප් ගසා පිළියෙල කර ගන්නේ නම් ඉතා මැනවි. කොළඹ 2, මැලේ වීදියේ විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් වෙත 1969 අගෝස්තු මස 15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ විභාගයේ නම ලිවීමට අමතක නොකරන්න. විභාග කොමසාරිස්ගේ හෝ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට එවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ ඇති ආකෘතියට සම නොවන ලෙස අයදුම්කරුවන්ට උවමනා අන්දමට පිළියෙල කොට එවන අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද භාරගනු නොලැබේ.

4. අයදුම්පත්‍රය විභාග කොමසාරිස් වෙත එවීමට ප්‍රථම 1969 ඔක්තෝබර් හා ඉන්පසු පවත්වනු ලබන සිංහල ගුරු විභාග සඳහා සංශෝධිත සිංහල ගුරු විභාග ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රය කියවා මනා අවබෝධයක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

5. මෙම ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය ආණ්ඩුවේ පොත් ආයතනයෙන් ශත 40 ක් ගෙවා මිලදී ගත හැකි ය. තැපෑලෙන් අවශ්‍ය අයට රුපියලක මනිඕඩරයක් හෝ පෝස්ටල් ඕඩරයක් විභාග කොමසාරිස් නමට එවීමෙන් ලබාගත හැකිය.

6. ඉහත 4 ඡේදයේ සඳහන් සිංහල ගුරු විභාග ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රයට අමතරව පහත සඳහන් සංශෝධනයන් ද (මෙම) 1969 ඔක්තෝබර් සිංහල ගුරු විභාගය සඳහා වලංගු වේ.

මෙම ව්‍යවස්ථාවේ 1 ඡේදය ඒ කොටස පහත දැක්වෙන අයුරින් සංශෝධනය විය යුතුය.

**1. විභාග පරිපාටිය :**

විභාගය කොටස් තුනකින් යුක්ත වේ. එනම්.—

A කොටස—ශාස්ත්‍රීය විෂයයන් පිළිබඳ ලේඛ්‍ය පරීක්ෂණය

B කොටස—වෘත්තීය විෂයයන් පිළිබඳ ලේඛ්‍ය පරීක්ෂණය.

C කොටස—ඉගැන්වීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය.

ඒ කොටස

**අනිවාර්‍ය විෂයයෝ.—**

(i) සිංහල භාෂාව හා සාහිත්‍යය  (ii) අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය

**වෛකල්පික විෂයයෝ.—**

(iii) ඉතිහාසය
(iv) භූගෝල විද්‍යාව
(v) පුරවැසිභාවය
(vi) චිත්‍ර කර්මය
(vii) මූලික ගණිතය
(viii) සාමාන්‍ය විද්‍යාව
(ix) ගෘහ විද්‍යාව
(x) ඉංග්‍රීසි
(xi) වාණිජ්‍යය
(xii) ගණකාධිකරණය
(xiii) ලඝු ලේඛනය හා යතුරු ලියනය
(xiv) කෘෂිකර්ම විද්‍යාව
(xv) ආර්ථික විද්‍යාව

වෛකල්පික විෂයයන් වශයෙන් ගණකාධිකරණය හෝ වාණිජ්‍යය හෝ ආර්ථික විද්‍යාව හෝ ලඝු ලේඛනය හා යතුරුලියනය හෝ තෝරාගනු ලබන අයදුම්කරුවකු විසින් අනිවාර්ය විෂයයක් වශයෙන් වාණිජ අංක ගණිතය තෝරා ගත යුතුයි.

සිංහල භාෂාව හා සාහිත්‍යය සඳහා පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. අනිකුත් සෑම විෂයයන් සඳහාම පැය 2 ක ප්‍රශ්න පත්‍රය බැගිනි.

මෙම කොටසින් සමත්වීමට අයදුම්කරුවකු විසින් අනිවාර්‍ය විෂයයන් දෙකෙන් ම ද වෛකල්පික විෂයයන් දෙකකින් ද සතුටුදායක ප්‍රමාණයක ප්‍රවීනතාවක් දක්විය යුතුය. අයදුම්කරුවකු විසින් වෛකල්පික විෂයයන් තුනකට වඩා නොගත යුතු ය.

2. මෙම ව්‍යවස්ථාවේ 5 පිටුවේ 9 ඡේදයට අමතර ව පහත සඳහන් සුදුසුකම් ඇති ගුරුවරු ද සිංහල ගුරු විභාගයේ '' ඒ '' කොටසින් නිදහස් කරනු ලැබෙත්.

වාණිජ අංකගණිතය, ගණකාධිකරණය, වාණිජ්‍යය, අර්ථ ශාස්ත්‍රය, ලඝුලේඛනය හා යතුරුලියනය යන විෂයයන් පහෙන් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ්‍යය ඇතිව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ වාණිජ අංකගණිතය, ගණකාධිකරණය, වාණිජ්‍යය, අර්ථ ශාස්ත්‍රය, ලඝුලේඛනය හා යතුරුලියනය යන විෂයයන් පහෙන් විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථ්‍යය සහිත වාර එකකදී හෝ දෙකකදී සිංහල භාෂාව සහ වාණිජ අංක ගණිතය හා තවත් විෂයයන් හතරකින් යන විෂයයන් හයෙන් ලබන ලද අධ්‍යාපන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) සමග,

ලංකා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ගණකාධිකරණය, වාණිජ්‍යය හා මුදල්, අර්ථ ශාස්ත්‍රය යන විෂයයන් තුනෙන් විෂයයන් දෙකක් එක් වාරයක දී සමත්වීම හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ගණන් තබන්නන්ගේ හෝ ලඝුලේඛක යතුරු ලියන්නන්ගේ උසස් වාණිජ සහතික පත්‍ර විභාගයෙන් හෝ විභාග දෙපාර්තමේන්තුවේ වාණිජ විද්‍යා සහතික පත්‍ර විභාගයේ ගණන් තබන්නන්ගේ හෝ ලඝුලේඛක යතුරු ලියන්නන්ගේ විභාගයෙන් හෝ සමත්වීම.

එවැනි අයදුම්කරුවන්ද එම අනුග්‍රහය කල් ඇතිව ලිපියකින් ඉල්ලා එවිය යුතුය.

**1969 ඔක්තෝබර් සිංහල ගුරු විභාගය සඳහා ආදර්ශ අයදුම් පත්‍රය**

1. විභාගයට ඉල්ලුම් කරන කොටස :————. (මෙහි ඒ හෝ බී යන්න ලොකු අකුරින් ලියන්න).

විභාග අංකය :————. (කාර්‍යාලයේ ප්‍රයෝජනය සඳහායි).

1. අයදුම්කරුගේ පුරුදු අත්සන :————.

ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන වග :————.

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(පූජකවරයෙක් හෝ මෙනවියක් හෝ මහත්මියක් හෝ නම් ඒ බව සඳහන් කරන්න. ගුරුවරයකු වශයෙන් පත්ව සිටී නම් පත්වීමේදී ව්‍යවහාර කළ නම ලිවිය යුතුය. එසේ නැතහොත් උප්පැන්න සහතිකයේ සඳහන් නම ලියන්න.)

3. ප්‍රවේශ පත්‍ර වැනි ලියවිලි එවිය යුතු ලිපිනය :————.

4. මධ්‍යස්ථානය (වඩාත්ම කැමති මධ්‍යස්ථානය පළමුවත් අනික්වා ඊට යටිනුත් ලියන්න) (ස්ථාන තුන ගැසට් නිවේදනයේ පළමුවැනි ඡේදයේ දක්වෙන මධ්‍යස්ථානයන් අතරින් තෝරාගත යුතු අතර ඒවා එකිනෙකට වෙනස් විය යුතුය).

(1) ————.
(2) ————.
(3) ————.

(අ) විභාග ගාස්තු සඳහා අවශ්‍ය මුද්දර මෙහි අලවන්න. (සිංහල ගුරු සහතික පත්‍ර විභාගයේ ''ඒ'' කොටස සඳහා රු. 25 යි. එම '' බී '' කොටස සඳහා රු. 20 යි)

5. (ආ) අලවා ඇති මුද්දරවල වටිනාකම රු. ————.

| මුද්දර අලවන කොටුව |
|---|
| මේ මුද්දර අයදුම්කරුගේ අත්සන හා දිනය යොද අවලංගු කර සහතික කළ යුතුය. මුද්දර එකපිට එක නොසිටින සේ ඇල විය යුතුය. |

6. '' ඒ '' කොටසේ වෛකල්පික විෂයයෝ (විෂය ඉදිරියෙහි ඇති කොටුව තුළ කතිරයක් — ගැසීමෙන් තමන් තෝරා ගන්නා විෂයයන් පහත දක්විය යුතුය. මේ කොටසින් විෂයයන් තුනකට වඩා තෝරා ගත නො හැකිය.) :—

| | | | |
|---|---|---|---|
| 3. ඉතිහාසය | | 9. ගෘහ විද්‍යාව | |
| 4. භූගෝල විද්‍යාව | | 10. ඉංග්‍රීසි | |
| 5. පුරවැසිභාවය | | 11. වාණිජ්‍යය | |
| 6. චිත්‍ර කර්මය | | 12. ගණකාධිකරණය | |
| 7. මූලික ගණිතය | | 13. ලඝුලේඛනය සා යතුරු ලියනය | |
| 8. සාමාන්‍ය විද්‍යාව | | 14. කෘෂිකර්ම විද්‍යාව | |
| | | 15. ආර්ථික විද්‍යාව. | |

7. දූනට ලබා ඇති පත්වීම් පිළිබඳ විස්තර :—

| | |
|---|---|
| (අ) පාසල, එහි ලිපිනය හා පාලනය | |
| (ආ) තත්ත්වය (ස්ථිර ද, ආධුනික ද වැඩ බලන හෝ තාවකාලික ද) | |
| (ඉ) අයදුම්කරු විසින් උගන්වනු ලබන විෂයයන් : (සාමාන්‍ය පාඨශාලීය විෂයයන් ද, පාඨශාලීය විශේෂ විෂයයන් ද) | |
| (ඊ) අයදුම්කරු විසින් උගන්වනු ලබන මාධ්‍යය : | |
| (උ) සතියකට උගන්වන පැ ගණන : | |
| (ඌ) ලැබෙන මාසික වැටුප (මූලික) | |

8. ගුරුවරයාගේ ලියාපදිංචි කළ අංකය හෝ එම පත්වීම පිළිබඳ නිකුත් කරන ලද ලියමනේ අංකය හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ තැන හෝ ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරි තැන විසින් පත්වීම අනුමත කිරීම පිළිබඳ ලියමනේ හෝ විස්තර මෙහි සඳහන් කළ යුතුය :————.

9. තමන් සමත් වූ අන් කිසි විභාගයක් නිසා හෝ සේවය නිසා හෝ නිදහසක් ඉල්ලන්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.
නිදහස ඉල්ලන්නේ කවර කොටසින් ද ? :————.

10. පාසැලේ කළමනාකාර තැන විසින් හෝ මුල්ගුරු තැන විසින් හෝ මේ කොටස පිරවිය යුතුය :—
මෙම අයදුම්කරු පිළිබඳ ලිපි ලේඛනාදිය මා පරීක්ෂා කළ බවත්, එම ලිපි ලේඛනාදිය අනුව මෙම අයදුම්පතෙහි 7 වැනි, 8 වැනි හා 9 වැනි කොටුවල ලියා ඇති කරුණු නිවැරදි බවත් සහතික කරමි.
පාසැලේ නම :————.
එහි පාලනය :————.

(ආණ්ඩුවේ පාසැලක් ද/අධ්‍යක්ෂ පාලිත පැසැලක් ද/අනුමත කළ ආධාර නොලබන පාසැලක් ද)
නම :————. අත්සන :————.
ලිපිනය :————. දිනය :————.

11. අයදුම්කරුගේ සහතිකය :—
මේ අයදුම්පතෙහි ලියන ලද කරුණු සැබෑ බවට මම සහතික කරමි.

මෙහි අලවා තිබෙන මුද්දර මා විසින් ඇලවූ බවත්, ඒවා මීට ඉහතින් පාවිච්චි නොකළා වූ ද දූනට වලංගු වූ ද, හො ද මුද්දර බවත් මෙයින් සහතික කරමි. තවද විභාග කොමසාරිස් විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට හා අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී පිළිපැදිය යුතු අණපනත්වලටත් එකහව ඉන් බැඳී සිටීමට ද මෙයින් පොරොන්දු වෙමි.

————,
දිනය :————. අයදුම්කරුගේ අත්සන.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (සෑම අයදුම්කරුවකුම සඳහා)—
————වන මම ඉහත සඳහන් අයදුම්කරු————පදිංචි කෙනෙකු බව ද, මා ඔහු/ඇ හොඳාකාර අඳුනන බවද, 1969 ක් වූ————මස, ————වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන.
තරාතිරම :————.
දිනය :————.

නම :————.
ලිපිනය :————.

සැ.යු.—අයදුම් පත්‍රයෙහි 12 කොටුවෙහි අයදුම්කරුගේ අත්සන සහතික කරවා ගැනීම පහත සඳහන් සුදුසුකම් ඇති අයෙකු ලවා කරවාගත යුතුය :—
(i) ගුරුවරයෙකු/ගුරුවරියක වන අයදුම්කරුවකු විසින් තමන් ඉගැන්වීම කරන පාසැලේ ප්‍රධානියා ඉදිරියේ අත්සන් තබා සහතික කරවාගත යුතුය.

(ii) දූනට/ගුරුවරයෙකු/ගුරුවරියක නොවන අයදුම්කරු විසින් තමන්ගේ අත්සන ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කළ පාසලක ප්‍රධානයකු, සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, පෙරකදෝරු කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, නාවික ගගණ හෝ ගොඩ යුද්ධ හමුදවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 2,400 හෝ ඊට වැඩි වාර්ෂික මූලික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු හෝ ලවා සම්පූර්ණ කරවාගත යුතුය.

නියමිත සුදුසුකම් ඇති අයෙකු විසින් තම අත්සන සහතික කරන ලද බවට අයදුම්කරු වගබලාගත යුතුය.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1969 ජූනි මස 23 වැනි දින,
කොළඹ 2 මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ දීය.

7-43—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## ටෙන්ඩර් කැඳවීමේ දූන්වීම්

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව—තිස්සමහරාම උප කොට්ඨාශය

1969 මැයි මස 30 වන දින ගැසට් නිවේදනය සම්බන්ධවයි

තිස්ස වැවේ රොන් මඩ ඉවත් කිරීම සඳහා ටැන්ඩර් කැඳවීමේ දිනයන් පහත සඳහන් අයුරු සංශෝධනය කළ බව මෙයින් දන්වා සිටිමි :—

ටැන්ඩර් නිකුත් කිරීමේ අන්තිම දිනය ... 1969 7 5
ටැන්ඩර් භාර ගැනීමේ අන්තිම දිනය ... 1969 7 8

ඕ. සී. අබේසේකර,
වාරිමාර්ග ඉංජිනේරු, තිස්ස උ. කො.

1969 ජූනි මස 20 දින,
තිස්ස වාරිමාර්ග කාර්යාලයේ දීය.

7-33—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: 418 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1) කපු කැන්වස් සැපයීම සඳහා 1969 සැප්තැම්බර් 30 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරිතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කල විට 1969 සැප්තැම්බර් 29 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩරකරුවන් සඳහා විශේෂ ටෙන්ඩර පෝරම සකස් කර තිබේ. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කල විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ජූලි 4 වැනි දින,
කොළඹදීය.

7–171—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය :—තැ. පෙ. 500,/418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1969.10.1 සිට 1970.9.30 තෙක් කොළපාට වැග් ලනු සැපයීම ... | 1969.8.19 |
| 2. 1969.10.1 සිට 1970.9.30 තෙක්, මෙරට සෑදූ ඇමුණුම් කටු හා ඇල් පෙනෙත්ති සැපයීම ... | 1969.7.29 |
| 3. 1969.10.1 සිට 1970.9.30 තෙක්, මෙරට සෑදූ යතුරු ලියන රිබන් පටි සැපයීම ... | 1969.7.29 |
| 4. මෙරට නිෂ්පාදිත කපු රෙදි පිළි සැපයීම ... | 1969.7.29 |
| 5. ගැල්වනයිස් යකඩ ජලනල සැපයීම | 1969.7.29 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969.7.4 දින,
කොළඹදීය.

7–170—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### රත්නපුර උප කොටස

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර උප කොට්ඨාසයේ වැල්ලාව අමුණ උඩින් පාලමක් ඉදිකිරීම සහ වැල්ලාව ව්‍යාපාරයේ වැඩි දියුණු කිරීම වැඩ සඳහා ටෙන්ඩර්පත්, කොළඹ 5, ජාවත්ත පාර, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ජූලි මස 23 වන බදාදා පෙරවරු 11 දක්වා භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. මෙම වැඩය සඳහා රු. 40,000 හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, ග්‍රාම සංවර්ධන සමිති වලට හා සමුපකාර සමිති වලට පමණක් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969 ජූලි මස 20 වන ඉරිදා දක්වා කාර්යාල වේලාවන්හි දී රත්නපුර/ගම්පහ/කළුතර/කොළඹ යන වාරිමාර්ග ඉන්ජිනේරු කාර්යාලයන්ගෙන් ලබා ගත හැකි, ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කල යුතුයි. ටෙන්ඩර් පෝර්මයන් ගැනීම සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචිය දැක්වෙන කොන්ත්‍රාත් වාර්තා පොත් සහ දැනට තමා යටතේ ඇති දෙපාර්තමේන්තු වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශණයක් වාරිමාර්ග ඉන්ජිනේරු තැන වෙත ඉදිරිපත් කිරීමට බැඳී සිටී. එය ටෙන්ඩර් පත් නිකුත් කිරීමට එම තනැත්තා සුදුසුද නුසුදුසුද යන්න දැන ගැනීමට වාරිමාර්ග ඉන්ජිනේරු තැනට උපකාරී වේ. මෙම හිස් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ඉහත සඳහන් ඕනෑම වාරිමාර්ග කාර්යාලයක හෝ කච්චේරියක රු. 50 ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වේ.

4. මෙම වැඩය ගැන වැඩි විස්තර රත්නපුර, හිදැල්ලන පිහිටි රත්නපුර උප කොටස භාර වාරිමාර්ග ඉන්ජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාල වේලාවන් ඇතුලත ලබා ගත හැකි වේ.

ජේ. ටී. ද සිල්වා,
වාරිමාර්ග ඉන්ජිනේරු,
රත්නපුර උප කොටස.

1969 ජූනි මස 25 වන දින,
හිදැල්ලන, රත්නපුර.

7-48—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පී.වී.සී/පී.අයි. හෝ සී. අයි. පයිප්ප හා සවි කරණයන් සැපයීමට හා ගෙනවිත් භාරදීම්

අංක 14,858 හා 1969. 6. 13 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ 1969. 6. 2 වැනි දින දරණ ටෙන්ඩර් දැන්වීම පිළිබඳවයි.

2. ඇල්. කිව්. 06.03.1 සිට ඇල් කිව්. 06.03.10 දක්වා ඇති ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 69. 7. 18 වැනි දින ප. ව. 2. 30 දක්වා දීර්ඝ කරන ලදී.

3. ඇල්.කිව්. 06.03.11 සිට ඇල්.කිව්. 06.03.20 දක්වා ඇති ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 69. 7. 19 වෙනි දින ප. ව. 2. 30 දක්වා දීර්ඝ කරන ලදී.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969. 6. 23 වෙනි දින,
පේරාදෙණිය, ගන්නොරුවේ,
කෘෂිකර්ම ඉංජිනේරු අංශයේදීය.

7-97—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මහකනදරාව උප කොටස

මහකනදරාව උප කොටස යටතේ මහකනදරාව කඳවුරට ජලනල මගින් ජලය සැපයීමේ සේවාව සඳහා ටෙන්ඩර් අයදුම් පත් අනුරාධපුර උතුරු මැද පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969.7.23 දින පෙරවරු 10 දක්වා භාර ගෙන එවෙලේම එදිනම විවෘත කරනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 45,000 කට හෝ ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවනට ග්‍රාමසංවර්ධන සමිති සහ සමුපකාර සමිති වලට මෙම සේවාව සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1969.7.18 දින දහවල් දොළහ දක්වා කාර්යාලයීය වේලාවන් තුළදී, මහකනදරාව, පදවිය, රාජාංගන හා අනුරාධපුර වාරිමාර්ග කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් අයදුම් පෝර්ම වල පමණක් අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් අයදුම්පත් ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන අයදුම් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත සහ ඔවුන් ඇනට දෙපාර්තමේන්තුවේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන සහතිකයක් වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 මුදලක් ඇප තැන්පත් මුදල් වශයෙන් වාරිමාර්ග කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක එම මුදල තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මේ අන්දමේ වැඩ සඳහා පළපුරුදුකම් හා එම සේවාවට අදාල සේවා භාණ්ඩ තිබෙන කොන්ත්‍රාත්කරුවනට පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ඇත.

4. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහකනදරාව වාරිමාර්ග ඉන්ජිනේරු කාර්යාලයෙන් රාජකාරි වේලාවන් තුළදී ලබා ගත හැක.

ඩී. ඊ. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉන්ජිනේරු තැන,
මහකනදරාව උ. කො.

1969.6.23 වැනි දින,
මහකනදරාව,
මාරිමාර්ග කාර්යාලයේ දී ය.

7-101—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### 1969–70 මුදල් වර්ෂය තුළ ටයර් සහ ටියුබ් සැපයීම

මෝටර් රථ, මෝටර් බයිසිකල්, මෝටර් ට්‍රක්ස් සහ ලොරි, ට්‍රැක්ටර්ස්, ට්‍රෙයිලර්ස්, ඩම්පර්ස්, අර්ත් මූවර්ස්, සතුන් බැඳි වාහන, ගුවන් යානා යනාදිය සඳහා ටයර් සහ ටියුබ් ආනයනය කරන වෙළඳ ආයතනවලින්, තමන් ගබඩාකර ඇති තොගවලින් සැපයිය හැකි ටයර් සහ ටියුබ් සඳහා අලුත්ම ශුද්ධ මිළ ගණන් දක්වෙන ලැයිස්තු පහත දක්වෙන ආකාරයට පිටපත් දෙකකින් යුතුව සම්පූර්ණ විස්තර සමඟ ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලනු ලැබේ.

(අ) නිතිපතා ආනයනය කොට ගබඩාකර තබා ගන්නාවූ ප්‍රමාණයන්.

(ආ) රජයේ ගබඩා ඇනවුම් අනුව තොගවලින් සැපයීමේදී අයකරන ශුද්ධ මිළ ගණන්.

2. රේගු බද්ද රහිතව ආනයනය කොට සැපයීම සඳහා අයකරන්නාවූ මිළ ගණන් සහිත විස්තරාත්මක ලැයිස්තු පිටපත් දෙකකින් යුතුව පහත දක්වෙන අයුරින් ඉදිරිපත් කරන ලෙස ආනයනය කරන්නවුන්ගෙන් ඉල්ලනු ලැබේ.

(අ) රේගු බද්ද රහිතව ආනයනය කර සැපයීමට හැකි ප්‍රමාණයන්.

(ආ) රේගු බද්ද රහිතව අනෙකුත් සියලුම අයකිරීම් සහිත ශුද්ධ මිළ ගණන්.

(ඇ) සෑම ටයරයක් සහ ටියුබයක් වෙනුවෙන් අවශ්‍ය විදේශ විනිමය.

(ඈ) රජයේ ඇනවුම් යටතේ රේගු බද්ද රහිතව ආනයනයකර සැපයීමට ගතවන කාලය.

3. රජයේ දෙපාර්තමේන්තුවලට අවුරුදු පතා අවශ්‍ය වන නානා ප්‍රමාණ වල ටයර් සහ ටියුබ් පිළිබඳ ඇස්තමේන්තුව ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම සඳහා ඇතුලත් කර ඇත. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී, මෙම ප්‍රමාණවලට පමණක් සීමා නොකොට, පළමුවැනි සහ දෙවැනි ඡේදවල ඇති ආකාරයට තමන් සාමාන්‍යයෙන් ආනයනය කරන්නාවූ සියලුම ප්‍රමාණවල ටයර් සහ ටියුබ් සඳහා මිළ ගණන් ඉදිරිපත් කරන ලෙස ටෙන්ඩර්කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ. මෙම ලැයිස්තුවේ දක්වෙන ප්‍රමාණය සාමාන්‍යයෙන් ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය වන අතර, ඒ සියල්ලම හෝ ඉන් කොටසක් හෝ මුලු තොගයම එකවර හෝ ඇනවුම් කරන්නේය යන්න ගැන පොරොන්දුවිය නොහැකි බව කරුණාවෙන් සලකන්න. ඒ ඒ ප්‍රමාණය යටතේ සඳහන් කර ඇති ගණනට වඩා හෝ අඩුව හෝ ඇණවුම් කළද ඒ සියල්ලම ඉදිරිපත් කර ඇති මිළ ගණන් අනුව සැපයිය යුතුය.

4. ඉදිරිපත් කරන්නාවූ රේගු බද්ද රහිත මිළ ගණන් කොළඹ නාගරික සීමාව ඇතුළත ගෙනැවිත් භාරදීමට හා කොළඹින් බැහැර යැවීමේදී ආසන්න දුම්රිය පොළට හෝ දුම්රිය බඩු ගබඩාවට ගෙනගොස් භාරදීමට වැයවන්නාවූද, ගාස්තු ද ඇතුලත් විය යුතුය.

5. ගබඩාකර ඇති තොගවලින් සැපයීමේදී සහ රේගුබද්ද රහිතව ගෙන්වා සැපයීමේදී, කොළඹින් බැහැර ස්ථානවල යවනවිට දුම්රිය ගාස්තු තමන් දරන්නේද යනවග පැහැදිලි ලෙස දක්විය යුතුය.

6. සපයන සෑම ටයරයකටම අනුක්‍රමික අංකයක් තිබිය යුතුය.

7. ළඟ ඇති තොගවලින් මිලයට ගනු ලබන්නේ හදිසියෙන් හා වහාම අවශ්‍යවන ප්‍රමාණයන් පමණකි. එසේ මිළයට ගනු ලබන්නේ සාර්ථක ටෙන්ඩර්කරුවන් ළඟ ඇති, විදේශ විනිමය සහතිකපත්‍ර ක්‍රමය යටතේ ආනයනකර තිබෙන තොගවලින් ය. රේගු බද්ද රහිතව ආනයනයකර සැපයීම සඳහා ඇණවුම් කරණ (සාමාන්‍යයෙන් තොග වශයෙන්) ටයර් හා ටියුබ් සඳහා අවශ්‍ය විදේශ විනිමය මෙම දෙපාර්තමේන්තුවෙන් මුද හරිනු ඇත. විදේශ විනිමය සහතික පත්‍ර ක්‍රමය මීට අදල නැත. මෙසේ කරන ලද ආනයනයන් සඳහා ආනයන බලපත්‍ර රජයෙන් ලබාදෙන බවත්, ඒ නිසා ආනයන බලපත්‍ර ගාස්තුවක් අයනොවන බවත්, සැලකිය යුතුය.

8. ශුද්ධ ලැයිස්තු මිළ ගණන් සහ අනිකුත් විස්තර පිටපත් දෙක බැගින් සකස් කර අංක 500 දරණ තැපැල් පෙට්ටිය යටතේ, කොළඹ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත, 1969 අගෝස්තු 26 වැනි අඟහරුවාද, පෙරවරු 9.30 ට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය. මිළ ගණන් බහා එවන කවරයේ "ටයර් සහ ටියුබ් සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ජුලි මස 4 වෙනි දින,
කොළඹ දී ය.

### 1969–70 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ටයර් සහ ටියුබ්වල වාර්ෂික අවශ්‍යතාවයන්

#### මගීන් සඳහා වූ කාර්වලට

| ප්‍රමාණයන් | ප්ලයි රේටිං | ටයර් | ටියුබ් නොමැති ටයර් | ටියුබ් |
|---|---|---|---|---|
| 5.20 × 12 | 4 ප්ලයි | 50 | — | 50 |
| 5.50 × 12 | 4 ප්ලයි | 50 | — | 50 |
| 5.20 × 13 | 4 ප්ලයි | 5 | — | 5 |
| 5.60 × 13 | 6 ප්ලයි | 10 | — | — |
| 5.60 × 13 | 4 ප්ලයි | 300 | — | 200 |
| 5.90 × 13 | 4 ප්ලයි | 125 | — | 75 |
| 6.40 × 13 | 4 ප්ලයි | 125 | — | 150 |
| 6.40 × 13 | 6 ප්ලයි | 25 | — | — |
| 6.50 × 13 | 4 ප්ලයි | 50 | — | 50 |
| 6.70 × 13 | 4 ප්ලයි | 10 | — | 75 |
| 6.70 × 13 | 6 ප්ලයි | 65 | — | — |
| 7.00 × 13 | 4 ප්ලයි | 10 | — | 10 |
| 7.25 × 13 | 4 ප්ලයි | 15 | — | 10 |
| 5.20 × 14 | 4 ප්ලයි | 10 | — | 10 |
| 5.90 × 14 | 4 ප්ලයි | 110 | — | 75 |
| 6.40 × 14 | 4 ප්ලයි | 150 | — | 100 |
| 7.00 × 14 | 4 ප්ලයි | 150 | — | 200 |
| 7.00 × 14 | 6 ප්ලයි | 75 | — | — |
| 7.50 × 14 | 4 ප්ලයි | 25 | — | 50 |
| 7.50 × 14 | 6 ප්ලයි | 25 | — | — |
| 5.00 × 15 | 4 ප්ලයි | 15 | — | 15 |
| 5.60 × 15 | 4 ප්ලයි | 100 | — | 100 |
| 5.90 × 15 | 4 ප්ලයි | 30 | — | 100 |
| 5.90 × 15 | 6 ප්ලයි | 50 | — | — |
| 6.40 × 15 | 4 ප්ලයි | 35 | — | 235 |
| 6.40 × 15 | 6 ප්ලයි | 225 | — | — |
| 6.70 × 15 | 4 ප්ලයි | 60 | — | 250 |
| 6.70 × 15 | 6 ප්ලයි | 150 | — | — |
| 7.10 × 15 | 6 ප්ලයි | 30 | — | 30 |
| 7.60 × 15 | 6 ප්ලයි | 175 | — | 50 |
| 5.25 × 16 | 4 ප්ලයි | 50 | — | 50 |
| 6.00 × 16 | 4 ප්ලයි | 50 | — | 50 |
| 6.50 × 16 | 6 ප්ලයි | 25 | — | 25 |
| 4.50 × 17 | 4 ප්ලයි | 5 | — | 5 |
| 5.00 × 17 | 4 ප්ලයි | 5 | — | 5 |
| 5.50 × 17 | 4 ප්ලයි | 15 | — | 15 |
| 5.20 × 10 | 4 ප්ලයි | 250 | — | 250 |

**මෝටර් සයිකල්, ස්කූටර්ස් සහ මෝපෙඩ්ස්**

| ප්‍රමාණයන් | ප්ලයි රේටිං | ටයර් | ටියුබ නොමැති ටයර් | ටියුබ |
|---|---|---|---|---|
| 3.00 × 16 | 4 ප්ලයි | 25 | — | 25 |
| 3.25 × 16 | 4 ප්ලයි | 150 | — | 150 |
| 3.25 × 17 | 4 ප්ලයි | 200 | — | 200 |
| 3.50 × 17 | 4 ප්ලයි | 250 | — | 250 |
| 3.00 × 18 | 4 ප්ලයි | 30 | — | 30 |
| 2.75 × 19 | 4 ප්ලයි | 60 | — | 60 |
| 3.00 × 19 | 4 ප්ලයි | 10 | — | 10 |
| 3.25 × 19 | 4 ප්ලයි | 500 | — | 500 |
| 3.50 × 19 | 4 ප්ලයි | 300 | — | 300 |
| 3.50 × 8 | 4 ප්ලයි | 25 | — | 25 |

**බර අඩු ට්‍රක්ස්**

| ප්‍රමාණයන් | ප්ලයි රේටිං | ටයර් | ටියුබ නොමැති ටයර් | ටියුබ |
|---|---|---|---|---|
| 7.00 × 15 | 6 ප්ලයි | 600 | — | 650 |
| 7.00 × 15 | 8 ප්ලයි | 50 | — | — |
| 7.50 × 15 | 10 ප්ලයි | 125 | — | 150 |
| 6.00 × 16 | 6 ප්ලයි | 200 | — | 200 |
| 6.50 × 16 | 6 ප්ලයි | 100 | — | 150 |
| 6.50 × 16 | 8 ප්ලයි | 30 | — | — |
| 7.00 × 16 | 4 ප්ලයි | 10 | — | 260 |
| 7.00 × 16 | 6 ප්ලයි | 250 | — | — |
| 7.00 × 16 | 8 ප්ලයි | 150 | — | 150 |
| 7.50 × 16 | 6 ප්ලයි | 500 | — | 850 |
| 7.50 × 16 | 8 ප්ලයි | 300 | — | — |
| 7.50 × 16 | 10 ප්ලයි | 50 | — | — |

**ජීප්**

| ප්‍රමාණයන් | ප්ලයි රේටිං | ටයර් | ටියුබ නොමැති ටයර් | ටියුබ |
|---|---|---|---|---|
| 7.00 × 15 | 6 ප්ලයි | 300 | — | 300 |
| 6.00 × 16 | 6 ප්ලයි ට්‍රැක් ග්‍රිප් | 5,000 | — | 5,500 |
| 6.00 × 16 | 6 ප්ලයි ඩබල් පර්පස් | 500 | — | — |
| 7.00 × 16 | 6 ප්ලයි | 400 | — | 400 |
| 7.50 × 16 | 6 ප්ලයි | 700 | — | 200 |

**ට්‍රක්ස්**

| ප්‍රමාණයන් | ප්ලයි රේටිං | ටයර් | ටියුබ නොමැති ටයර් | ටියුබ |
|---|---|---|---|---|
| 8.25 × 16 | 8 ප්ලයි | 5 | — | 5 |
| 10.50 × 13 | 10 ප්ලයි | 20 | — | 20 |
| 9.00 × 16 | 10 ප්ලයි | 200 | — | 200 |
| 10.50 × 16 | 12 ප්ලයි | 50 | — | 50 |
| 7.00 × 17 | 8 ප්ලයි | 5 | — | 5 |
| 7.50 × 17 | 8 ප්ලයි | 15 | — | 75 |
| 7.50 × 17 | 10 ප්ලයි | 50 | — | — |
| 8.25 × 17 | 14 ප්ලයි | 25 | — | 25 |
| 6.00 × 20 | 8 ප්ලයි | 10 | — | 10 |
| 6.50 × 20 | 8 ප්ලයි | 300 | — | 300 |
| 7.00 × 20 | 10 ප්ලයි | 1,500 | — | 1,500 |
| 7.00 × 20 | 12 ප්ලයි | 25 | — | — |
| 7.50 × 20 | 10 ප්ලයි | 250 | — | 1,800 |
| 7.50 × 20 | 10 ප්ලයි ට්‍රැක්ෂන් ලග් | 25 | — | — |
| 7.50 × 20 | 12 ප්ලයි | 750 | — | — |
| 7.50 × 20 | 12 ප්ලයි ට්‍රැක්ෂන් ලග් | 750 | — | — |
| 8.25 × 20 | 10 ප්ලයි ට්‍රැක්ෂන් ලග් | 50 | — | 1,000 |
| 8.25 × 20 | 12 ප්ලයි | 500 | — | — |
| 8.25 × 20 | 12 ප්ලයි ට්‍රැක්ෂන් ලග් | 500 | — | — |
| 9.00 × 20 | 12 ප්ලයි | 25 | — | 25 |
| 10.00 × 20 | 12 ප්ලයි | 150 | — | 300 |
| 10.00 × 20 | 14 ප්ලයි | 150 | — | — |
| 11.00 × 20 | 14 ප්ලයි | 50 | — | 50 |
| 12.00 × 20 | 14 ප්ලයි | 50 | — | 50 |
| 14.00 × 20 | 12 ප්ලයි | 25 | — | 25 |
| 9.00 × 24 | 10 ප්ලයි | 5 | — | 5 |
| 11.00 × 24 | 14 ප්ලයි | 10 | — | 25 |
| 18.7 × 7 | 6 ප්ලයි | 5 | — | 5 |
| 7 × 9 | 10 ප්ලයි | 5 | — | 5 |
| 600 × 9 | 6 ප්ලයි | 15 | — | 15 |
| 25 × 6 | 8 ප්ලයි | 10 | — | 15 |
| 25 × 6 | 12 ප්ලයි | 5 | — | — |
| 27 × 6 | 12 ප්ලයි | 25 | — | 25 |

**ට්‍රැක්ටර්**

| ප්‍රමාණයන් | ප්ලයි රේටිං | ටයර් | ටියුබ නොමැති ටයර් | ටියුබ |
|---|---|---|---|---|
| 4.00 × 19 | 4 ප්ලයි | 300 | — | 300 |
| 6.00 × 16 | 6 ප්ලයි | 300 | — | 300 |
| 6.00 × 19 | 4 ප්ලයි | 50 | — | 150 |
| 6.00 × 19 | 6 ප්ලයි | 75 | — | — |
| 10 × 28 | 4 ප්ලයි | 50 | — | 50 |
| 11 × 28 | 4 ප්ලයි | 100 | — | 150 |
| 11 × 28 | 6 ප්ලයි | 50 | — | — |
| 11 × 36 | 4 ප්ලයි | 100 | — | 100 |
| 11 × 36 | 6 ප්ලයි | 125 | — | 125 |
| 13.50 × 32 | 6 ප්ලයි | 40 | — | 40 |
| 7.50 × 16 | 8 ප්ලයි | 50 | — | 50 |

**ට්‍රේලර්**

**අර්ත් මුවර්, ඩම්පර් සහ ග්‍රේඩර්**

| ප්‍රමාණයන් | ප්ලයි රේටිං | ටයර් | ටියුබ නොමැති ටයර් | ටියුබ |
|---|---|---|---|---|
| 8.25 × 18 | 8 ප්ලයි | 10 | — | 10 |
| 10.00 × 24 | 14 ප්ලයි | 30 | — | 30 |
| 12.00 × 24 | 16 ප්ලයි | 5 | — | 5 |
| 13.00 × 24 | 8 ප්ලයි | 10 | — | 25 |
| 13.00 × 24 | 12 ප්ලයි | 15 | — | — |
| 14.00 × 24 | 14 ප්ලයි | 20 | — | 60 |
| 14.00 × 24 | 16 ප්ලයි | 30 | — | — |
| 14.00 × 24 | 20 ප්ලයි | 5 | — | — |
| 18.00 × 24 | 16 ප්ලයි | 5 | — | 5 |
| 21.00 × 24 | 20 ප්ලයි | 10 | — | 10 |
| 18.00 × 25 | 24 ප්ලයි | 5 | — | 25 |
| 21.00 × 25 | 24 ප්ලයි | 10 | — | 10 |
| 24.00 × 25 | 28 ප්ලයි | 10 | — | 10 |
| 16.00 × 25 | 24 ප්ලයි | 5 | — | 5 |
| 29.5 × 25 | 28 ප්ලයි | 5 | — | 5 |
| 26.5 × 25 | 20 ප්ලයි | 5 | — | 5 |
| 7.50 × 24 | 10 ප්ලයි | 5 | — | 5 |

7–172—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට " ඩබල් බොයිල්ඩ් ලින් සීඩ් ඔයිල් " සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 355, ලංකා දුම්රිය දෙපාර්තමේන්තු මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති තැන විසින් 1969 ඔක්තෝබර් මස 5 වැනි ඉරිදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාරගැනීමට සහ හරියාකාරව ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව, අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 ඔක්තෝබර් මස 4 වැනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1969 ඔක්තෝබර් මස 5 වැනි ඉරිදා පෙරවරු 11.05 ට ලංකා දුම්රිය දෙපාර්තමේන්තු මූලස්ථානයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1969 ජූනි මස 27 දින,
කොළඹ දීය.

7–180—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යාපනය උප කොට්ඨාශය

යාපනය උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා වවුනියාවේ උතුරු පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1969 ජූලි මස 30 වැනි බදාදා පෙරවරු 10.00 තෙක් ටෙන්ඩර් පත් භාරගෙන එවේලෙහිම ටෙන්ඩර් පත් විවෘත කිරීම සිදු කෙරේ :—

| | වැඩෙහි විස්තර | ලියාපදිංචි ගණන | තැන්පත් මුදල් |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1. | මරුදන්කුලම් ව්‍යාපාරය යටතේ කුඹුරු ඇල වල් 1 සිට 11 දක්වා හා ඩී/1 ඇල නිර්මාණ කිරීම | 38,000 | ... 50 |
| 2. | මුරුකණ්ඩිකුලම් වම් ඉවුරු ප්‍රධාන ඇල යටතේ කුඹුරු ඇලවල් 7 සිට 17 දක්වා නිර්මාණ කිරීම | 47,000 | ... 50 |
| 3. | අම්බලපෙරුමාල් කුලම් ව්‍යාපාරයේ වම් ඉවුරු යටතේ 1 සිට 9 දක්වා කුඹුරු ඇල වල් නිර්මාණ කිරීම | 61,000 | ... 100 |
| 4. | වන්නේරිකුලමේ වාරිමාර්ග හා ලභාවීමේ අපහසුකම් සමීක්ෂණ සඳහා දියුණුව හා අලුත්වැඩියා කිරීම | 29,000 | ... 50 |
| 5. | ඉරණමඩුකුලමේ බැම්මෙහි යූ/එස්—බැවුමෙහි 37 දම්වල සිට 53 දම්වල දක්වා කලුගල් බිත්තිය නිර්මාණ කිරීම | 35,000 | ... 50 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යථෝක්ත ගණන් වලට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති පමණක් මෙම වැඩ සඳහා මේ ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට සුදුස්සන් වෙති.

3. 1969 ජූලි මස 26 වන දින, පස්වරු 3.00 දක්වා කාර්යාලය වේලාවන් තුළදී, යාපනය, මන්නාරම, වවුනියා, මුලතිව් හා වවුනික්කුලම් යන වාරි මාර්ග ඉංජිනේරු කාර්යාලය වලින් ලබාගත හැකි ආකෘති පත්‍ර වල ටෙන්ඩර් පත් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ස්වකීය ලියාපදිංචි පොත් සහ දනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරණ වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, යථෝක්ත එක් එක් විෂයය යටතේ දක්වෙන ටෙන්ඩර් තැන්පත් මුදල් යථෝක්ත ඕනෑම වාරිමාර්ග කාර්යාලයක තැන්පත් කිරීම හෝ එම මුදල කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීම කළ යුතුය.

4. මෙම ටෙන්ඩර් සම්බන්ධව වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී, කිළිනොච්චියේ යාපනය උප කොට්ඨාශයේ, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇස්. සෝමසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
යාපනය උප කොට්ඨාශය.

කිළිනොච්චිය,
1969.6.20 වැනි දින.

7–157—69.7.4. දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන නිලධාරී—කොළඹ

1969/70 වර්ෂයේ ප්‍රථම භාගයට ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් කොට්ඨාශයන් වෙනුවෙන් ටෙන්ඩර් ම විසින් කැඳවනු ලැබේ :—

(අ) කළුතර දිස්ත්‍රික්කයේ : හැඩිගල්ල, වරතල්ගොඩ, ඉහලහෙ- වැස්ස, පැලවත්ත පාලම් අංශය, පැලවත්ත මාර්ග තැනීමේ අංශය සහ පැනියාවල ව්‍යාපාරය ;

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ : හක්වටුණාඔය, විල්ගම් දෙමටාව, කළුගල්ල, වෙල්ලන්ගිරිය ;

(ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ : අයගම, දෙල්ගොඩ, කරවිට, කුකුලේගම, මඩලගම සහ වරතල්ගොඩ.

(ඈ) කොළඹ දිස්ත්‍රික්කයේ : කිරිලපන මධ්‍යම කාර්මික හල සහ ගබඩාව, කොළඹ 6., කොළන්නාව වැඩ බිම, රත්මලාන වැඩ බිම, ප්‍රධාන කාර්යාලය දිගු කිරීමේ අංශය, කොළඹ 1., ජාතිති ශ්‍රමදාන අංශය, අංක 120, ඇල්ස්ටන් පෙදෙස, කොළඹ 2.

කොළඹ 2 : ඇල්ස්ටන් පෙදෙසේ කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1969 අගෝස්තු මස 2 වැනි දින පෙරවරු 10.15 දක්වා 1969/70 මුදල් වර්ෂයේ ප්‍රථම භාගය සඳහා පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීමේ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

(1) වියන ලද ජෝඩු පොල් අතු (අඩි 7ක් දික්වූද, අඟල් 14ක් පළල් වූද ජෝඩු පොල් අතු—1,000 ක මිල.)

(2) අලු හුණු බුසල් 1 (එකක්) (රු. 44 කට නොඅඩු බර තිබිය යුතුය) බුසලක මිල.

(3) තම්බාපු හුණු බුසලක මිල.

(4) කළුගල්—4"×6" කියුබ් එකක මිල.

(5) කළුගල්—6"×9" කියුබ් එකක මිල.

(6) තලාපු ගල් 2" කියුබ් එකක මිල.

(7) තලාපු ගල් 1½" කියුබ් එකක මිල.

(8) තලාපු ගල් 1" කියුබ් එකක මිල.

(9) තලාපු ගල් ¾" කියුබ් එකක මිල.

(10) තලාපු ගල් ½" කියුබ් එකක මිල.

(11) පිළිස්සූ ගඩොල්—පිළිගත් ප්‍රමාණය 4½"×2 ¾"×8 /4" 1,000 ක මිල.

(12) ගං වැලි—කියුබ් එකක මිල.

2. කරුණාකර සපයන අන්දම සහ වැඩ බිම කරා ගෙනවුත් නියමිත අයුරු අසුරා තැන්පත් කිරීම සඳහා වෙන් වෙන්ව මිල ගණන් සඳහන් කල යුතුය.

(අ) පෝරණුවෙන්, ගල් වලෙන්, වත්තෙන් (දෙපාර්තමේන්තු ලොරි යායුතු ස්ථාන කලින් පෙන්නුම් කල යුතුය)

(ආ) කොන්ත්‍රාත්කරු විසින් වැඩබිමට ගෙනවුත් භාරදීම ඔහුගේ වාහන වලින්, (පැටවීම, බෑම සහ නියමිත අයුරු ඇසිරීම ඇතුලත්ව)

3. පොල් අතු සහ හුණු සැපයීම සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් එක් ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50 ක් බැගින් ද, පොල් අතු සහ හුණු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රු. 50 ක් බැගින් ද තැන්පත් කර ලබාගත් රිසිට්පත් ටෙන්ඩර් අයදුම් ආකෘති ලබා ගැනීමට ප්‍රථම මා වෙත ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් අයදුම් ආකෘති 1969 අගෝස්තු 1 වෙනි දින පස්වරු 3 දක්වා මගේ කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

4. සෑම ටෙන්ඩර් අයදුම් කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය ඉතා පැහැදිලිව සඳහන් කල යුතුය. හුණු සහ පොල් අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් සෑම ව්‍යාපාරයකටම පිටපත් දෙක බැගින් ද පිළියෙල කල යුතුය. සියළුම ටෙන්ඩර් අයදුම්පත් ලියා පදිංචි කරන ලද තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. කවරයෙහි වම්පස උඩ කෙලවරෙහි "කොළඹ ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි උපකරන සැපයීම සඳහා ටෙන්ඩර් පත්" යනුවෙන් ඉතා පැහැදිලිව සටහන් කළයුතුය :—

කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරී,
කොළඹ ඉඩම් සංවර්ධන කාර්යාලය,
අංක : 120, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ—2.

නැතහොත් කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරිගේ කාර්යාලයෙහි ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුයි. 1969 අගෝස්තු මස දෙවන දින පෙරවරු 10.15 ට පසු රෙජිස්ටර් තැපෑලෙන් ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරන අතර ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කරනු නොලැබේ.

5. සාර්ථකවූ ටෙන්ඩර්කරු ඒ බව දැන්වීමෙන් සති දෙකක් ඇතුලත ද්‍රව්‍ය භාරදීමට හැකිවිය යුතුය. යමෙකුට එසේ කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ නම කොන්දේසි කඩකල කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛණයට ඇතුලත් වන්නේ ය.

6. ටෙන්ඩර් කරුවන්හට අවශ්‍යනම් 1969 අගෝස්තු 2 වෙනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් ගණනාවක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හෝ ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ අයිතිය හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය ඉඩම් සංවර්ධන නිලධාරි සතුය.

එම්. අයි. එම්. නාලීර්,
කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරී.

1969 ජූනි 18 වැනි දින,
කොළඹ 2 හි පිහිටි ඩබ්ලිව්. ඒ. ඩී. රාමණායක පෙදෙසේ,
අංක 120 දරන ස්ථානයෙහි
කොළඹ ඉඩම් සංවර්ධන කාර්යාලයේ දීය.

7–18—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තු ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

1. කලියවඩන ඇල වැඩි දියුණු කිරීම ... දකුණු පිටිගල් කෝරළය
2. මැද ඇල දිය දෙර ඉදිකිරීම ... දකුණු පිටිගල් කෝරළය
3. පාළුගහ පිටවේල්ල ගං වතුර හානි ... දකුණු පිටිගල් කෝරළය
4. මුදලක්කුලිය වැව සොරොව්ව ඉදිකිරීම ... කුමාර වන්නි පළාත
5. ඉපලෝගම වැව වැඩිදියුණු කිරීම ... රාජ වන්නි පළාත
6. ගන්දරවැව වැඩිදියුණු කිරීම ... දකුණු පිටිගල් කෝරළය

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූලි මස 18 දින දවල් 12 දක්වා හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩරකරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ, වම් කෙළවරේ "..................... සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 ජූලි මස 24 දින දවල් 12 ට පෙර හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යැයි හැඟෙන හේතූන් උඩ, හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළ යුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරන නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජූලි මස 25 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මූළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ලෙස්ලි ෆොන්සේකා ගුණසේකර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කය.

හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා
සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 ජූනි මස 24 දින දීය.

[illegible] දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සඳහා 4′×4′ ප්‍රමාණයේ ලී තට්ටු සෑදීම, සැපයීම සහ ගෙනවුත් භාරදීම**

දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන සැලැස්ම අනුව ලී තට්ටු සාදා ගෙනවුත් භාරදීම සඳහා 1969 ජූලි 18 වැනි දින ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරනු ලබන උපලේඛනයේ සඳහන්ව ඇති පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නොයෙකුත් නි. මි. යෝ. ක්‍රා. ගබඩා වලට මෙම ලී තට්ටු භාර දිය යුතුය.

2. රුපියල් 250 (රුපියල් දෙසිය පණහක්) තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිපත් කිරීමෙන් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍ර වල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ, ප්‍රධාන ගණකාධිකාරි වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කරනු ලබන රුපියල් 30,000 (රුපියල් තිස්දාහ) ක හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සහ වඩු කර්මාන්ත වැඩ සඳහා ලියාපදිංචි වූ රජයේ අනුමත කොන්ත්‍රාත්කරුවකට 1969 ජූලි 18 වැනි දින දහවල් 12 දක්වා

ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. රුපියල් 1,00,000 කට හෝ ඊට වැඩි වැඩක් භාර ගතහැකි බවට ප්‍රදේශයේ ස. සං. උ. කොමසාරිස් ගෙන් ලබාගන්නා ලද ලිපියක් ඉදිරිපත් කිරීමෙන් ලියාපදිංචි වඩු කර්මාන්ත සමුපකාර සමිතිවලටද ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. තැපැලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරනු ලබන අය විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනයට හා වේලාවට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි එසේ කළ යුතුය.

4. මෙම සැපයීම් 69.9.30 ට පෙර අවසන් කළ යුතුය. සැපයිය යුතු ප්‍රමාණය 2,136 කි.

5. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42, දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගැනීම මැනවි.

වී. ඊ. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජූලි 4 වැනි දින,
කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

7–154—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය—සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

| | වැවේ නම | වැඩෙහි ස්වභාවය | ගොවිකාරක සභා ප්‍රදේශය |
|---|---|---|---|
| කුච්චවෙලි ආදායම් පාලක කොට්ඨාශය— | | | |
| 1. | කුන්චුකුලම් | වැඩිදියුණු කිරීම | පුදුවෙලිකුලම් |
| 2. | පූවර්සාන්කුලම් | නැවත ගොඩ නැගීම | කුඹුරුපිඩි |
| 3. | ආඩන්වලෙයිකාදන් වැව | වැඩි දියුණු කිරීම | කුඹුරුපිඩි |
| 4. | පෙරිල්ලකුලම් | වැඩි දියුණු කිරීම | වාමන්ලකුලම් |
| 5. | ඇනිවිලුන්දන්කුලම් | වැඩි දියුණු කිරීම | තෙන්නමරවාඩි |
| 6. | ඔඩ්ඩුපුල්ලුකුලම් | නැවත ගොඩනැගීම | වාමලන්කුලම් |
| 7. | කුසවනාර්තු | අමුණ අළුත්වැඩියා කිරීම | කුසවනාර්තුවෙලි |
| 8. | පොයිහායිකුලම් | සොරොව්ව ගොඩනැගීම | කුසවනාර්තුවෙලි |
| 9. | ඉරුවසිආරු | ජලප්‍රමාණකය ගොඩනැගීම | කුසවනාර්තුවෙලි |
| 10. | වාමලන්කුලම් | වාන ගොඩ නැගීම | සාමලන්කුලම් |
| 11. | ඔඩ්ඩන්කුලම් | ඇල ගොඩනැගීම | වන්නියාර්වෙලි |
| 12. | කලිකද්දුකුලම් | සොරොව්ව අළුත් වැඩියා කිරීම | ආන්දන්කුලම් |
| 13. | වාමලන්කුලම් | හරස් පාර ගොඩ නැගීම | වාමලන්කුලම් |
| මුතූර් ආදායම් පාලක කොට්ඨාශය— | | | |
| 1. | වෙප්පන්කුලම් | සොරොව්ව අළුත් වැඩියා කිරීම | කට්ටපරච්චාන් |
| 2. | කුරවත්වට්ටුවාන්කුලම් | වැඩි දියුණු කිරීම | චෙන්නයියූර් |
| 3. | වේලන්කුලම් | වැඩි දියුණු කිරීම | |
| 4. | කරාඩිපලිකුලම් | වැඩි දියුණු කිරීම | සාම්පූර් |
| 5. | චෙම්බියාදිකොතු | ගංවතුර බැම්ම ගොඩනැගීම | කිරාන්දකුලම් |
| 6. | සිරුලාන්කුලම් | සොරොව්ව ගොඩනැගීම | සාම්පූර් |
| ගොමරන්කඩවෙල ආදායම් පාලක කොට්ඨාශය— | | | |
| 1. | කුඩා ඇතාබැඳි වැව | වැඩි දියුණු කිරීම | ඇතා බැඳිවැව |
| කින්නියා ආදායම් පාලක කොට්ඨාශය— | | | |
| 1. | මහමාර්කුලම් | වැඩි දියුණු කිරීම | මහමාර්සල්ලිකල්ලපු |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර, 1969 ජූලි මස 19 දින දවල් 12 දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ ".........සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 ජූලි මස 23 දින දවල් 12 ට පෙර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නාවූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම් දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර් කරු විසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩර්යේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වූවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමමේ හෝ බලය රජයට ඇත.

8. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන්ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජුලි මස 24 දින පෙ.ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළහැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 ජුනි මස 21 දින දීය.

ඒ. ෂන්මුගරාජා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.

7–38—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

### මින්නේරිය ජවපොලෙහි ගොඩනැගිලි විස්තාරණය කිරීම

රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාර තැන වෙත ඉහත සඳහන් කාර්යය කර භාරදීම සඳහා 1969 ක්වූ අගෝස්තු මස 13 බදාදා පූ. භා. 10 දක්වා කොළඹ පාර්සන්ස් පාරේ රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 540) විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධ ලිය කියවිලි කොළඹ පාර්සන්ස් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාල යෙහි දී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100 මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5 ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි ළඹ ආපසු ගෙවනු ලැබේ.

3. තම ලියා පදිංචිය ඔප්පු කරනු ලැබිය හැකි, රුපියල් පනස් දහස කට (රු. 50,000) නොඅඩු ගොඩනැගිලි වැඩ සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවන්හි ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරි පත් කිරීම සඳහා සුදුස්සන් වන්නෝය.

4. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලයි. එම 1969 ක්වූ අගෝස්තු මස 9 දහවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. එම 1969 ක්වූ අගෝස්තු මස 13 බදාදා පූ. භා. 10 ට රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇම්. අයි. අසීස්,
රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ,
ප්‍රධාන කළමනාකාර තැන.

1969 ජුලි මස 4 දින,
තැ. පෙ. 540,
කොළඹ.

7–104—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### 1970 දින දර්ශනය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 1970 දින දර්ශන මුද්‍රණ කොට සැපයීම සඳහා පිළිගත් මුද්‍රණ සමාගම්වලින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර ආපසු ගෙවනු ලබන රු. 100 ක මුදලක් ගෙවීමෙන් ප්‍රධාන සැපයීම් නිළධාරී තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ටෙන්ඩර්පත් භාර ගැනීම 1969 ජුලි මස 15 වෙනි දින පෙ. 10 ට අවසන් වේ.

113, ගාලු පාර,
කොළඹ 3.

ප්‍රධාන සැපයීම් නිළධාරී තැන.

7–181—69.7.4. දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් දැන්වීමයි

1970 වර්ෂයට අවශ්‍ය ඇනෝලිෆ් වේතන ලැයිස්තු මුද්‍රණය කර සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 අගෝස්තු මස 3 වෙනිදා පෙරවරු 10 වනතෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර නියමිත පෝර්මවල ලියා අනුපිටපතකින් ද, යුක්ත කොට එවිය යුතුයි. මෙම පෝර්මපත් කොළඹ 5, කිරුළ පාරේ නො. 200 දරණ ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක නිලධාරිතැනගේ කායසීලයෙන් 1969 අගෝස්තු මස 2 වෙනිදා දවල් 12 වනතෙක් ලබාගත හැකිය. පෝර්මපත් ලබාගැනීමට කොළඹ 5, කිරුළ පාරේ නො. 200 දරණ ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම්නිලධාරි තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත්කර ඒ වෙනුවෙන් ලබාගන්නා ලද පිසිට්පත ඉදිරිපත් කල යුතුයි.

වැඩි විස්තර ප්‍රධාන සම්පාදක නිලධාරි තැනගේ කායසීලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

නො. 200, කිරුළ පාර,
කොළඹ 5,
1969.6.27.

7–182—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### පාවිච්චි කරන ලද ටයර හා ඇලුමිනියම් කැබලි විකිණීම අපහරණ අංගනය—වේරහැර, බොරලැස්ගමුව

වේරහැර, බොරලැස්ගමුව, ලං. ග. ම. අපහරණ අංගනයේ තිබෙන කැබලි ඇලුමිනියම් හා පාවිච්චි කරන ලද ටයර මිලයට ගෙන හැරගෙන යාම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර ඒ ඒ ද්‍රව්‍ය ඉදිරියෙන් දක්වා ඇති දිනවල පෙ. ව. 10 වනතෙක් කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති තැන විසින් බාරගනු ලැබේ.

1. ඇලුමිනියම් :—

(ඒ) පවිත්‍ර ඇලුමිනියම් කැබලි ටොන් 19, හෝ 08 පමණ ප්‍රමාණයක්

(බී) සායම් තැවරුනු ඇලුමිනියම්—ටොන් 25, හෝ 08 ක පමණ ප්‍රමාණයක්

**1969.7.30 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් බාරගැනීම අවසාන කරනු ලැබේ.**

**2. පාවිච්චි කරන ලද ටයර.**—එක් තොගයකට 100 බැගින් වූ නොයෙක් ප්‍රමාණයේ නැවත පිරවිය හැකි ටයර 2000 ක් පමණ හා එක් තොගයකට 100 බැගින් වූ නොයෙක් ප්‍රමාණයේ අබලන් හෙයින් ඉවත් කරන ලද ටයර 5000 ක්.

**1969.8.3 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් බාරගැනීම අවසාන කරනු ලැබේ.**

ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ, අංක 200 දරණ ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත (අංක 1) යටතේ සඳහන් ඇලුමිනියම් වලට මුදලින් රු. 100 ක් හා (අංක 2) යටතේ සඳහන් ටයර වෙනුවෙන් එක් තොගයකට මුදලින් රු. 50 බැගින් වූ උපරිම වශයෙන් රු. 1,000 දක්වා වූද මුදලක් තැන්පත් කර ලබා ගන්නා පිසිට්පත මගේ කායසීලය වෙත ඉදිරිපත් කල විටය. ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනයන්ට පෙර දින දහවල් 12 වනතෙක් ටෙන්ඩරපත්‍ර නිකුත් කරනු ලැබේ. කායසීලීය වේලාව ඇතුලතදී මෙම ද්‍රව්‍ය පරීක්‍ෂා කල හැකිය.

වැඩි විස්තර මාගේ කායසීලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරී තැන.

සම්පාදක කොට්ඨාශය,
200, කිරුළ පාර,
කොළඹ 5.

7–183/1—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### ට්‍රක් රථ ප්‍රමාණයේ ෆෑන් බෙල්ට්ස් විකිණීම—අපහරණ මධ්‍යස්ථානය, රත්මලාන

රත්මලාන ලං. ග. ම. අපහරණ මධ්‍යස්ථානයේ තිබෙන ට්‍රක්රථ ප්‍රමාණයේ ෆෑන්බෙල්ට්ස් මිලයට ගෙන හැරගෙනයාම සඳහා එවනු ලබන ටෙන්ඩර්පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි සිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකාවල විස්තර වන පරිදි, කොන්ටිනෙන්ටල්, ගුඩ් ඉයර්, ඩන්ලොප්, ජොන් බුල්, පෙරෝග්‍රිප්, සහ ෆයර්ස්ටෝන් යනාදි වර්ගවලට අයත් මෙම ෆෑන් බෙල්ට් තොග වෙනුවෙන් වෙන වෙනම මිළ ගණන් සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් භාරගැනීමට නියමිත අවසාන දිනයට පෙර දින දහවල් 12 වන තෙක් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මය පිටපත් දෙකකින් යුක්ත කොට මුද්‍රා තබා එවිය යුතුයි. ටෙන්ඩර පෝර්ම නිකුත් කරනු ලබන්නේ කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි සිටින ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ටෙන්ඩර තැන්පත් මුදල වශයෙන් මුදලින් රුපියල් 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

1969.7.31 වෙනි දින පෙ. ව. 10 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරනු ලැබේ.

සාමාන්‍යයෙන් වැඩ කරන වේලාවන් තුළ රත්මලාන ලං. ග. ම. අපහරණ මධ්‍යස්ථානයේදී මෙම ෆෑන් බෙල්ට්ස් පරීක්‍ෂා කළ හැකිය. වැඩි විස්තර මගේ කායසීලයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

සම්පාදක කොට්ඨාශය,
200, කිරුළ පාර, කොළඹ 5.

7–183/2—69.7.4 දන අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 584 යේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් අවිස්සාවේල්ල නව රෝහලේ පල්දෝරු ක්‍රමය 1 වැනි පියවර ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 ජූලි මස 29 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම්වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 ජූලි මස 18 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ පල්දෝරු ක්‍රම ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 100ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලටද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ:—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමූපකාර සංගම් රෙජිස්ත්‍රාර් තැන විසින් ලියාපදිංචි කොට ඇති සමූපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ, සෙලින්කෝ මන්දිරයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකිය. සේවයේ විස්තරද, ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනයද, කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිල දී ගැනීමට අවශ්‍ය අවසර පත්‍රය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙරටින් ලබා ගත නොහැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමද, නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගෙන් ලබා ගත හැක.

එස්. ඊ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 ජූනි මස 26 වනදා,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

7–155—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් දැන්වීමක් සංශෝධනය කිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අ/හොරොව්පොතාන මහා විද්‍යාලයේ පංති කාමර 8 ක දෙමහල් ගොඩනැගිල්ල තැනීම සඳහා 1969 ජූනි මස 13 වැනි දිනැති අංක 14,858 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ 995 වැනි පිටුවේ පළ කර ඇති ටෙන්ඩර් දැන්වීමේ පහත සඳහන් සංශෝධනයන් කර ඇති බව මෙයින් දැනුම්දෙමි.

(1) මෙම වැඩය සඳහා ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය ලියාපදිංචිය රු. 1,00,000 රු. 90,000 කි.

(2) ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීම 1969 ජූලි මස 16 වැනි දින දවල් 12 දක්වා ය.

(3) ටෙන්ඩර් භාරගැනීමේ දිනය 1969 ජූලි මස 18 වැනි දින පෙ. ව. 10.30 දක්වා ය.

7–69—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 25 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| විද්‍යාලයේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කො/ටෙම්ප්ලර්ස් පාර යෝජිත විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල තැනීම ආදිය. |
| 2. කො/ඉසිපතන මහා විද්‍යාලය | විද්‍යාගාරයට වැඩි දියුණු කිරීම්. |
| 3. කො/දෙමටගොඩ ශාන්ත ජෝන් මහා විද්‍යාලය | අළුත් වැඩියාව. |
| 4. කො/පන්නිපිටිය ධර්මපාල මහා විද්‍යාලය | විද්‍යාගාරයට වැඩි දියුණු කිරීම්. |
| 5. කො/ගංගොඩවිල කණිෂ්ඨ විද්‍යාලය | වහලය නැවත තැනීම. |
| 6. කො/සමුද්‍රදේවි බාලිකා මහා විද්‍යාලය | වැසිකිළි තැනීම. |
| 7. කො/අකරවිට මහා විද්‍යාලය, කොස්ගම | අළුත් වැඩියාව සහ කැසිකිලි තැනීම. |

සංලක්ෂ්‍යය.—කො = කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2 මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 රු. 35,000, අංක 2 සහ 3 රු. 15,000, අංක 4, 5, 6 සහ 7 රු. 7,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1969 ජූලි මස 24 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇනවුම් තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් ග්‍රීන්පාත්, කොළඹ 7 අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව ග්‍රීන්පාත්, කොළඹ 7 අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 ජූලි මස 25 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන කාර්යාලය යේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6ක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. ජ්. බී. මුණසිංහ,
අධ්‍යාපනාධ්‍යක්ෂ, කොළඹ ප්‍රදේශය.

1969.6.27 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

7–178—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## මොරටුවේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ආපන ශාලාව සඳහා ටෙන්ඩර් කැඳවීම

ඉහත සඳහන් ආපන ශාලාව පවත්වාගෙන යාමේ අයිතිය සඳහා ටෙන්ඩර් 1969 ජූලි මස 19 වැනි දින දහවල් 12 දක්වා මොරටුව කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ විසින් භාර ගනු ලැබේ. සියළුම ටෙන්ඩර් රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. අධ්‍යක්ෂගේ කාර්‍යාලයෙන් ලබා ගත යුතු ෆෝර්මයෙහි එකී ටෙන්ඩර් ලිවිය යුතු අතර, ඒ ෆෝර්ම ලබාගත හැක්කේ, මොරටුවේ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂ කාර්‍යාලයේ දී රු. 50 ක් ගෙවා නිසි පරිදි ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් බවත් සැළකිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම 1969 ජූලි මස 18 වැනි දින දහවල් 12 න් පසු නිකුත් කරනු නොලැබේ.

පිළිගන්නා ලැබූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කොන්දේසි නිසි සේ ඉටු කිරීමේ හා උපකරණ ආරක්ෂාව සඳහා ඇප වශයෙන් රු. 1,000 ක් බැඳිය යුතුය.

පිළිගන්නා ලැබූ ටෙන්ඩර්කරු මසකට කුලිය වශයෙන් රු. 50 ක් විද්‍යායතනයට ගෙවිය යුතු අතර, විදුලි බලය සඳහා මසකට රු. 100ක් ගෙවිය යුතුය. භෝජනාගාර බලපත්‍ර ගාස්තුවද ඔහු මොරටුව පළාත් ආණ්ඩු සභාවට ගෙවිය යුතුය.

සෑම ටෙන්ඩරයක්ම හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීම හෝ ආපනශාලා කොන්ත්‍රාත්තුව ඕනෑම විටෙක අවලංගු කිරීමද අධ්‍යක්ෂ තැනට බලය ඇත. පිළිගන්නා ලද ටෙන්ඩර්කරු අධ්‍යක්ෂ සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. ඒ සඳහා අවශ්‍ය මුද්දර ගාස්තුව ටෙන්ඩර්කරු දැරිය යුතුය.

වෙනත් වැඩි විස්තර මොරටුව කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ අධ්‍යක්ෂගේ කාර්‍යාලයට පැමිණ හෝ ලියා විමසන්න.

එල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

1969 ජූනි මස 26 වැනි දින,
මොරටුව,
කටුබැද්දේ
ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ දී ය.

7–169—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් $1\frac{1}{2}$ කළුගල් කියුබ් 500 ක් රත්මලානට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 ජූලි මස 18 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක්ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉන්ජිනේරු තැන වෙත 1969 ජූලි මස 11 වැනි දින පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් ෆෝර්ම ද කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉන්ජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

1969 ජූනි 26 වැනි දින,
තැ. පෙ. 370,
කොළඹ.

7–159—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### වාප්පුවේ සිට බඩු ඉවත් කිරීම හා ප්‍රවාහණය කිරීම

ඉහත සඳහන් සේවාවන් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය, 1969 ජූලි මස 10 වන දින පස්වරු 3 දක්වා දීර්ඝ කොට ඇත.

මේ සඳහා ආපසු ලබාගත හැකි රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් සහ ආපසු නොගෙවන රුපියල් 10 ක ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් පසු, 1969 ජූලි මස 9 වන දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් සහ ටෙන්ඩර් කොන්දේසි පහත සඳහන් අයගෙන් ලබාගත හැක.

සැපයීම් කළමනාකරු.

ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
සැපයීම් හා වාප්පු දෙපාර්තමේන්තුව,
55, රොස්මීඩ් පෙදෙස, කොළඹ 7.

7–175—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### වානේ තහඩු සැපයීම

වානේ තහඩු පිටරටින් ගෙන්වා සැපයීම සඳහා, කොළඹ 3, ගාලු පාරේ 113 පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර ආපසු ලබා ගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් ප්‍රධාන සැපයීම් නිළධාරි තැනගේ කාර්යාලයෙන් 69.7.10 දින පෙරවරු 10 දක්වා ලබාගත හැක.

ටෙන්ඩර් පත් භාර ගැනීම 69.7.10 දින පස්වරු 2 ට අවසන් වේ.

ප්‍රධාන සැපයීම් නිළධාරී.

113, ගාලු පාර,
කොළඹ 3.

7–120—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## මහජන බැංකුව

බණ්ඩාරවෙල මහජන බැංකු ශාඛාවේ සුරක්ෂිතාගාරයක් සහ කළමනාකාර නිවාසයක් ඉදි කිරීම සඳහා පිළිගත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත් නැවතත් කැඳවනු ලැබේ.

පසුගිය වසර දෙක ඇතුළත රුපියල් 1.50,000 හෝ ඊට වැඩි අගය ඇති තනි ගොඩනැගිල්ලක් සතුටුදායක ලෙස නිම කළ බවට සාක්ෂි එස්. එච්. පීරිස් සහ ආනන්ද පීරිස් ගෘහ නිර්මාණ ශිල්පීන් වෙත ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන්ට හැකි වියයුතුයි. ගෘහ නිර්මාණ ශිල්පීන් වෙත සුදුසුකම් පිළිබඳව සාක්ෂි සතුටුදායක ලෙස ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවනට පමණක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

කොළඹ 7, විජේරාම මාවතේ, අංක 27 දරණ පරිශ්‍ර දෙපාර්තමේන්තුවේදී, කාර්යාල වේලාවන්හි මෙම ගොඩනැගිලි පිළිබඳ අඟල් $\frac{1}{8}$ පරිමාණ සැලසුම් $\frac{1}{4}$" හා $\frac{1}{2}$" සවිස්තර සැලසුම් පත් ඇතුළත් සියලුම සැලසුම් පත් කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය වේ නම් බලා ගතහැක.

කොළඹ 1, සෙලින්කෝ මන්දිරයේ, පස්වන මහලේ පිහිටි එස්. එච්. පීරිස් සහ ආනන්ද පීරිස් ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් 1969 ජූලි මස 7 වන දින සිට 1969 ජූලි මස 15 දින දක්වා කාර්යාලයීය වේලාවලදී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. අඟල් $\frac{1}{8}$ පරිමාණ සැලසුම්, ප්‍රමාණාත්මක සැලසුම්, සවිස්තර සැලසුම් සහ සම්භාර බිල්පත් වෙනුවෙන් රු. 50 ක ටෙන්ඩර් ගාස්තුව ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළයුතුය. මෙම මුදල ආපසු දෙනු නො ලැබේ. විස්තර සැලසුම් ලබා ගැනීමට කැමැති අය අමතර රු. 100ක ගාස්තුවක් ගෙවා ගෘහ නිර්මාණ ශිල්පීන් ගෙන් ඒවා ලබා ගත යුතුය.

සියලුම ටෙන්ඩර් පත් හෝ ඕනෑම ටෙන්ඩර් පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුය.

"බණ්ඩාරවෙල මහජන බැංකු ශාඛාව සඳහා ටෙන්ඩර් පත" යනුවෙන් සඳහන් කොට මුද්‍රා තැබූ ටෙන්ඩර් පත්, කොළඹ විජේරාම මාවතේ, අංක 27 දරණ ස්ථානයේ මහජන බැංකුවේ සැපයීම් හා පරිශ්‍ර නිලධාරි තුමා වෙත 1969 ජූලි මස 25 දින සවස 4.30 ට පෙර ලැබිය යුතුය.

සැපයීම් හා පරිශ්‍ර නිලධාරී.

මහජන බැංකුව,
අංක 27, විජේරාම මාවත,
කොළඹ 7,
1969.6.20.

7–109—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1969 ඔක්තෝම්බර් මස 1 වනදා සිට 1970 සැප්තැම්බර් මස 30 වනදායින් අවසන් වන වර්ෂය තුළ මේ සමඟ ඇති උප ලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති අමු කොස් කොළ හා තණ කොළ සැපයීමට එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ.

2. මෙම කාර්යාල මගින් සපයන ලද පෝර්මවල පමණක් පිටපත් දෙක කින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. මේ සමඟ ඇති උප ලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයෙහි සිටිය හැකිය. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂකගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මෙ සමඟ ඇති උප ලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලටලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙර දින දවල් 12ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුය. තැපැලෙන් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබා ගත හැකිය.

6. සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය පෝර්ම එම කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින්, තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

7. සෑම ටෙන්ඩර්යක්ම ඉහත සඳහන් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තැනගේ නමට එවිය යුතුය. සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂකවරයාට පුද්ගලිකව භාරදීමෙන් හෝ එය ලැබුන බවට කුවිතාන්සියක් ලබා ගත හැක. ටෙන්ඩර් කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපැලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දින පෙ.ව. 10ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. ආයතනයට අවශ්‍ය අමු කොස් කොළ හා තණකොළ ප්‍රමාණය දළ වශයෙන් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තුමාගෙන් ලබා ගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටිපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීම ද නැතහොත් සියලු ම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය ද රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම් පත් එවීමෙන් දැනගත හැකිය.

වෛද්‍ය කේ. නිත්‍යානන්ද,
වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ.

1969 ජූනි මස 23 වැනි දින,
කොළඹ 8,
වෛද්‍ය පර්යේෂණායතනය.

### උප ලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල | (3) ඈප මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 1. වෛද්‍ය පර්යේෂණ ආයතනයට තණකොළ සැපයීම | ...රු. 100 0 | ...රු. 400 0 | 1969. 7.25 උදේ 10.0 |
| 2. වෛද්‍ය පර්යේෂණායතනයට අමු කොස් කොළ සැපයීම | ...රු. 100 0 | ...රු. 300 0 | 1969. 7.25 උදේ 10.0 |

7–49—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—අංගොඩ

පහත සඳහන් හිස් ගෝනි විකිණීම සඳහා අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරී විසින් 1969.8.10 වන දින දහවල් 10.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| ද්‍රව්‍ය අංකය | භාණ්ඩය | දල වශයෙන් ප්‍රමාණය |
|---|---|---|
| 1 | හිස්ගෝනි (හාල්) | 721 |
| 2 | එම (සීනි) | 278 |
| 3 | එම (පරිප්පු) | 368 |
| 4 | එම (පිටි) | 108 |
| 5 | එම (කුඩා) | 128 |
| 6 | එම (සාමාන්‍ය) | 550 |
| 7 | එම (ලුණු) | 25 |
| 8 | රෙදි (පිටි) | 4500 |
| 9 | හිස්බෝතල (දෙඩම්) | 250 |
| 10 | හිස් පොලිතින් මලු | 112 |
| 11 | කඩදාසි මලු | 112 |
| 12 | හිස් පොලිතින් මලු (කුඩා) | 2000 |

2. ඉහත සඳහන් හිස් ගෝනි අංගොඩ මානසික රෝහලේ මුලුතැන්ගෙය, බේකරිය හා කිරිපට්ටියේදී පෙර පෝය දිනයන්හි හා පෝය දිනයන්හි හැර සතියේ දිනයන්හි පෙ.ව. 9 සිට ප.ව. 3.30 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

3. ටෙන්ඩර්කරුවන් විසින්ම ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම්පස උඩ කෙළවරේ හිස් ගෝනි විකිණීම සඳහා ටෙන්ඩර් යනුවෙන් සඳහන් කල යුතුය.

4. අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරී වෙත රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩරයට අමුණා එවිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍රය ඉහත සඳහන් පලමු ඡේදයේ සඳහන් දිනයට හා ඊට පෙර ලැබෙන සේ ලියා පදිංචි කල තැපැලෙන් එවිය යුතුය. නැතහොත් අංගොඩ මානසික රෝහලේ පාලක ලේකම් මහතා වෙත බාර දී එය ලැබුණ බවට කුවිතාන්සියක් ලබාගත යුතුය.

6. කිසිම ප්‍රශ්ණයක් නොමැතිව ටෙන්ඩර සමහරක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් හෝ භාර ගැනීමේ අයිතිය රජය සතුය. මෙම දැන්වීමේ ඇති සෑම කොන්දේසියක් ම නොපිළිපැද තිබුනොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

7. පලමුවන ඡෙදයේ සඳහන් දිනය හා වේලාව මානසික රෝහලේ වෛද්‍ය අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරන අතර එම අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට එම ස්ථානයේ පෙනී සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ කියවනු ලැබේ.

8. තේරුණු ටෙන්ඩර්කරු ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින 7ක් ඇතුලත දී ඒ ඒ විෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මිල ගනන් සම්පූර්ණයෙන්ම අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරී වෙත ගෙවිය යුතුය. එලෙස මුදල් ගෙවා දින තුනක් ඇතුලතදී මේ භාණ්ඩයන් භාරගෙන මානසික රෝහලේ භූමියෙන් ඉවත් කරගත යුතුය.

9. ඉහත සඳහන් වන 8 වන ඡෙදයේ සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ.

10. තවත් අවශ්‍ය විස්තර වෙතොත් අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරී ගෙන් ලබා ගත හැක.

ඇම්. ජී. ජයසුන්දර,
මානසික රෝහලේ අධිකාරී.

මානසික රෝහල,
අංගොඩ, 1969 ජූනි මස 10වැනි දින.

7–98—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, ආයතනයන්ට 1969. 12. 31 න් අවසන් වන කාලයට කුකුල් මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969. 7. 25 දින අ. භා. 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969. 7. 25 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනු පිට පතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 6. 26 දින,
කොළඹ 1.
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

7–160—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩ කරවා ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම

වර්ෂ 1969 ජූලි මස 25 වෙනි දින පස්වරු 2.30 දක්වා මෙහි පහත සඳහන් වැඩ සඳහා කොළඹ 1, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

(i) දෙරවක—මිනීමැරුම පාරේ 1 වන සැතපුමේ වැඩ

(ii) කෝදපාලුව ජනපදයේ පඩිපෙල හා අඩිපාලම තැනීම.

2. ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් ගාලුමුවදොර මහ ලේකම් කාර්යාලයේ 3 වෙනි මාලයේ අංක 357 දරන කාමරයේ තබා ඇති පෙට්ටියේ බහාලිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් 1969 ජූලි මස 25 දින පෙ. ව. 11.30 වනතෙක් ලබා ගත හැක. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් පෝර්ම හැර වෙනත් පෝර්ම වලින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර හා ටෙන්ඩර් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසිවලට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ ඉඩම් කොමසාරිස් කාර්යාලයේ හෝ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැන්පත්කර ඒ වෙනුවෙන් ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙකකින් යුතුව එවිය යුතු අතර, එසේ එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රාතබන ලද කවරයක බහා එවිය යුතුයි.

5. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැබිය යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බවට දැනුම් දීමෙන් දින හතක් ඇතුළත දී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩරය බාරගත් බව සඳහන් වන ලියවිල්ල ඔහුට පුද්ගලිකව බාරදීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බැව් දන්වූ බව පිළිගැනෙනවා ඇත. එසේ දැනුම්දීමෙන් පසුව ගිවිසුම් පත්‍රය අත්සන් තැබීම අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂෙප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. කෑගල්ලේ දිසාපතිතැනගේ අවසරයක් නොලබා වැඩ ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ බාරදීමට හෝ පුළුවන්කමක් නැත. එසේම පත්කරනු ලබන ටෙන්ඩර්කරු වැඩය කරන ප්‍රදේශයෙන් අවශ්‍යතාවයේ හැටියට පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් සේවය සඳහා යෙදවිය යුතුයි.

8. ලියාපදිංචි සමුපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති සහ වාරිමාර්ග, රජයේ වැඩ, දුම්රිය, ඉඩම් කොමසාරිස් හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවී ඇති (රු. 50,000 හෝ ඊට වැඩි) කොන්ත්‍රාත් කරුවන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

9. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අවශ්‍ය නම් කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

ජී. ඒ. ඇම්. කරුණාරත්න,
කෑගල්ලේ දිසාපති වෙනුවට.

1969 ජූනි මස 19 දින,
කෑගල්ලේ කච්චේරියේදීය.

7–11—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩ කරවා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත විස්තර දක්වා ඇති සේවාව සඳහා 1969.7.18 වෙනි දින දවල් 10.00 දක්වා ග්‍රාම සංවර්ධන සමිතිවලින්ද, සමුපකාර සමිති වලින්ද සහ වාරිමාර්ග, රජයේ වැඩ දුම්රිය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති (රු. 5,000 ට වැඩි) කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර් එදිනම සවස 3.00 ට විවෘත කරනු ලැබේ.

| | ජනපදයේ නම | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | වසම |
|---|---|---|---|
| 1. | නිව්බෝල්ඩ් ජනපදයේ ළිං 3 ක් තැනීම. | ... බෙලිගල් කෝරළය ... | නාරන්ගොඩ |
| 2. | ග්‍රෙස්ලින් ජනපද පාරේ බෝක්කු තැනීම. | ... කිණිගොඩ කෝරළය ... | පුවක්දෙනිය |
| 3. | පඹේගම ජනපදයට ළිං 3 ක් තැනීම | ... අටුළුගම් කෝරළය ... | හිඟුරලකන්ද |
| 4. | පොල්දෙනිය ජනපදයට ළිඳක් තැනීම | .. ගල්බඩ කෝරළය ... | නිකපිටිය |
| 5. | රූනපාන ජනපදයේ ළිං දෙකක් තැනීම | ... බෙලිගල් කෝරළය ... | ඉඹුල්ගල වසම |
| 6. | හල්ලව ජනපදයට ජල පහසුකම් සැපයීම | ... බෙලිගල් කෝරලය ... | වේරගොඩ |

2. කෑගල්ල දිසාපතිතුමාගෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගෙන, ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් උඩ කෙලවරේ "................." (ඒ ටෙන්ඩරයේ නම සඳහන් කරන්න.) යන්න සඳහන් කර සීල්තබා දිසාපති, කෑගල්ල යන්න එහි ලිපිනය පැහැදිලිව ලියා ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් අනුපිටපත් සහිතව එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් නොඑවතොත්, ටෙන්ඩර් කරුවන් හෝ ඔහුගේ නියෝජිතයන් විසින් ටෙන්ඩර් පත්‍ර දිසාපති වෙත හෝ ඔහුගෙන් බලය ලත් නිලධාරීතුමා වෙත පුද්ගලිකව භාර දිය යුතුයි.

4. ලියා පදිංචි කළ තැපෑලෙන් එවනු ලබන සියළුම ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ටෙන්ඩර් විවෘත කරන දිනයේම ටෙන්ඩර් කරුවන් වෙත එවනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් වසන දිනයේ සිට දින 4ක් තුළ එවැනි ලිපියක් නොලැබුණහොත් ඔහු වහාම දිසාපතිගෙන් ඒ ගැන විමසිය යුතුයි. එසේ කරුණු විමසීමේ දී ටැන්ඩරය පිළිබඳ විස්තරත්, ටෙන්ඩර් කරුගේ ලිපිනයත්, ටෙන්ඩරය ලේඛනගත තැපෑලෙන් යවනු ලැබී නම් එහි ලේඛනගත ලිපියේ අංකයත් දැක්විය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දිනයේ උදේ 9.30 වනතෙක් ටෙන්ඩර් පත්‍ර දෙනු ලැබේ. එවේලේ නිකුත් කරනු ලබන සෑම ටෙන්ඩරයක් වෙනුවෙන්ම රු. 25 ක් කෑගල්ලේ දිසාපතිතුමා නමින් තැන්පත් කර ඒ වගට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. මෙසේ ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයකදී කළ හැකියි. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවා එසේ ඔහුගේ ටෙන්ඩරය තෝරාගත් බව දන්වා සති තුනක් ඇතුළත, අවශ්‍ය ඇප මුදලක් තැන්පත් කර සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම සඳහා ගිවිසුම්පත් අත්සන් කළ යුතුයි. එසේ කිරීම නොවුවහොත්, ඒ ටෙන්ඩර්කරුවාගේ නම වැඩ පැහැර හැරිය ටෙන්ඩර්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ. තෝරාගනු ලැබුවාවූ ටෙන්ඩරයේ වටිනාකමින් 5% ක ඇප මුදලක් තැන්පත් කළ යුතුයි. එසේ මුදල් තැන්පත් කිරීම ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයකදී කළ හැකියි.

6. නියමිත ටෙන්ඩර් පෝර්මයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි වලට පටහැනිව සකස් වී ඇති සියළුම ටෙන්ඩර් පත්‍ර, පිළිගත නො හැකි ටෙන්ඩර් පත්‍ර ලෙස සලකනු ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් ඉතා පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, එහි යම් වෙනස් කිරීමක් හෝ කටුගෑමක් ඇත්නම් එය ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා අවලංගු කළ යුතුයි.

7. ටෙන්ඩරයේ, ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ඉතා පැහැදිලිව ලිවිය යුතුයි.

8. යම් ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නැතිනම් ටෙන්ඩරයකින් කොටසක් පිළිගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

9. පත්කර ගනු ලැබුවාවූ ටෙන්ඩර්කරුවන් එම සේවාව සඳහා "ලාංකික" කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934, 19 වැනි අංකය දරන කම්කරු ආඥා පණතේ (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ සේවකයෙකු වෙනුවෙන් වන්දිය ඉල්ලා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් දෙන ලද කොන්ත්‍රාත්කරුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත්, එය ඔහුගේ අතට භාර දුන්නාසේ සැලකිය යුතුයි.

12. වැඩට ගැනීම නුසුදුසු යයි කල්පනා කරන යම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම සේවකයෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකු සමග නම ඇතුළත්ව හෝ ටෙන්ඩර් මණ්ඩලය විසින් විරුද්ධවන කිසිවකු හෝ සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකට වත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

15. මේ පිළිබඳව වැඩි විස්තර කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් සතියේ වැඩ කරන දිනවල උදේ 9.00 සිට සවස 4.30 දක්වා ලබා ගත හැකියි.

16. 5 වැනි වගන්තිය යටතේ සඳහන් ටෙන්ඩර් පෝරම සඳහා මුදල් හෝ ඇප මුදල් තැන්පත් කිරීමට ග්‍රාම සංවර්ධන සමිති හෝ සමුපකාර සමිති හෝ කම්කරු සමිති බැඳී නැත.

17. 16 වැනි වගන්තිය යටතේ සමිති දැනට ක්‍රියාත්මක සමිති බවට ග්‍රාම සංවර්ධන උප අධ්‍යක්ෂකගෙන්, සමුපකාර සංවර්ධන උප කොමසාරිස් සහ කම්කරු උප කොමසාරිස් ගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

ජී. ඒ.ඇම්. කරුණාරත්න
කෑගල්ලේ දිසාපති වෙනුවට.

1969 ජූනි මස 19 වැනි දින,
කෑගල්ලේ දිසාපති කාර්යාලයේදීය.

7–12—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## මාතලේ දිස්ත්‍රික්කය

### නාලන්ද තානායමේ විවෘත ගරාජයක් තැනීම සඳහා

මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්ද තානායමේ විවෘත ගරාජයක් තැනීම සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පිණිස ම විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1969 ජූලි මස 25 වැනි දින දවල් 12.00 දක්වා භාරගනු ලැබේ. 1969 ජූලි මස 25 දින ප. ව. 2.30 ට සියළුම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට එදින නියමිත වේලාවට ටෙන්ඩර් මණ්ඩලයේ ඉදිරිපිට පෙනී සිටිය හැක.

2. ටෙන්ඩර් පත් මාතලේ දිසාපති තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත්, මාතලේ දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රයේ ඇති සියලුම වෙනස් කිරීම් ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන තබා සහතික කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර මාතලේ දිසාපති කාර්යාලයෙන් 1969 ජූලි 24 දින ප. ව. 4. 30 දක්වා ලබාගත හැක. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් පෝර්ම හැර, වෙනත් ටෙන්ඩර් පෝර්ම වලින් එවන ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ.

4. නාලන්ද තානායමේ විවෘත ගරාජයක් තැනීම සඳහා රු. 25 ක් තැන්පත් කොට ලබා ගන්නා ලද කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර පත් ලබාගත හැක. එසේම එවනු ලබන ටෙන්ඩර් පත් මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුයි. එකී කවරයේ වම් පස උඩ කෙළවරේ "නාලන්ද තානායමේ විවෘත ගරාජයක් තැනීම" යනුවෙන් සඳහන් කළ යුතුයි.

5. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් 5% ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි. එසේම ටෙන්ඩර්කරු තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා දිනපහක් ඇතුළත දී වැඩ ගිවිසුම් පත් අත්සන් කිරීමට පැමිණිය යුතුයි. එසේ කිරීමට අතපසු කළහොත් හෝ වැඩ ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩර් සියල්ල හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීමට මාතලේ දිසාපතිට හැක.

7. මාතලේ දිසාපති තැනගේ අවසරයක් නොලබා ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාරදීමට පුළුවන් කමක් නැත. එසේ පත්කර ගන්නා ලද ටෙන්ඩර්කරු වැඩය කරවන ප්‍රදේශයේ අවශ්‍යතාවයන් අනුව පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් යෙදවිය යුතුයි.

8. ටෙන්ඩර් පත් ලබාගත හැක්කේ ලියාපදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන්ය. ලියාපදිංචි නොවූ අයකු නම් තමාට රු. 5,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන ගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතුයි.

9. ලියාපදිංචි සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය නැත. සමිති ලියාපදිංචි කළ බවට සහ වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවට ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරීන් ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. තවද, වැඩය භාරගෙන කිරීමට සතුටු බව ප්‍රකාශ කරන සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිට පතක් ඉදිරිපත් කළ යුතුයි.

10. වැඩි විස්තර අවශ්‍ය නම්, මාතලේ දිසාපති කායඝීලයෙන් ලබා ගත හැක.

ඊ. තේවනේසම්,
මාතලේ දිසාපති වෙනුවට.

1969 ජූනි 24 වනදා,
දිසාපති කාර්යාලය,
මාතලේ.

7–44—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## මාතලේ දිස්ත්‍රික්කය

### කණ්ඩලම ජනපදයේ සහ ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ බෙදූ දී ඇති ඉඩම් කට්ටිවල ප්‍රවේශ මාර්ග තැනීම

මාතලේ දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මෙහි පහත සඳහන් වැඩ සඳහා වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969.7.29 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ. 1969.7.29 දින පස්වරු 2.30 ට සියළුම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් ඉල්ලුම් කරුවන්ට එදින නියමිත වේලාවට ටෙන්ඩර් මණ්ඩලය ඉදිරිපිට පෙනී සිටිය හැක.

වැඩ ලැයිස්තුව :

(i) කණ්ඩලම ජනපදයේ 1 වන පියවරේ ඇතුළත පාර සහ බෝක්කු දෙකක් බැඳීම.

(ii) ගලේවෙල පත්කොලගොල්ල ජනපදයට පිවිසෙන පාර හා බෝක්කුවක් බැඳීම.

2. ටෙන්ඩර් පත්‍ර මාතලේ දිසාපති වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් මාතලේ දිසාපති කායඝීලයේ ඉඩම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රයේ ඇති සියළුම වෙනස් කිරීම් ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන යොදා සහතික කළ යුතුයි. වැඩ කීපයක් සඳහා ටෙන්ඩර් පත්‍ර එවන විට එක් එක් වැඩය සඳහා වෙන් වෙන්ව ලියුම් කවර පාවිච්චි කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර මාතලේ දිසාපති කායඝීලයේ ඉඩම් අංශයෙන් 1969. 7. 23 වැනි දින පස්වරු 2.30 දක්වා ලබාගත හැක. මෙසේ ලබාගන්නා ටෙන්ඩර් පෝර්මවල හැර වෙනත් ටෙන්ඩර් පෝර්ම වල ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. මාතලේ දිසාපති කායඝීලයේ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් එක් වැඩක් සඳහා රු. 25 බැගින් තැන්පත් කර ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. එසේම එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබන ලද කවරයක බහා එවිය යුතුයි. එකී කවරයේ වම්පස උඩ කෙළවරේ තමා ඉල්ලුම් කරනු ලබන වැඩයේ නම සඳහන් කළ යුතුයි.

5 තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් මුළු මුදලින් සියයට පහක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බවට දන්වා දින හතක් ඇතුළත

වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට පැමිණිය යුතුයි. එසේ කිරීමට අපාපසු කලහොත් හෝ වැඩ ගිවිසුම අත්සන් කිරීමට ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩර් සියල්ල හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීම හෝ ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම මාතලේ දිසාපති සතුය.

7. මාතලේ දිසාපති තැනගේ අවසරයක් නොලබා ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීම හෝ බාරදීමට පුළුවන් කමක් නැත. එසේම පත්කර ගන්නා ලද ටෙන්ඩර්කරු වැඩය කරවන ප්‍රදේශයෙන් අවශ්‍යතාවය අනුව පුහුණු හෝ නුපුහුණු ලාංකික කම්කරුවන් යෙදවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක්කේ ලියාපදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන්ය. ලියාපදිංචි නොවූ අය තමාට රු. 15,000 වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතුයි.

9. ලියාපදිංචි සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර්පත්‍ර ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත. සමිති ලියාපදිංචි කළ බවට වැඩය බාරගෙන කිරීමට හැකියාවක් ඇති බවටද ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරින්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. තවද, වැඩය බාරගෙන කිරීමට සතුටු බව ප්‍රකාශ කරන සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිට පතක්ද ඉදිරිපත් කළ යුතුයි.

10. වැඩි විස්තර අවශ්‍ය නම් මාතලේ දිසාපති කායාීලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

එච්. එච්. ඇම්. ජී. ජී. විජේරත්න,
මාතලේ දිසාපති වෙනුවට.

දිසාපති කායාීලය,
මාතලේ, 1969. 6. 24 දින.

7–148––69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඉආ/1/238.

## අම්පාර කච්චේරිය

පහත සඳහන් වැඩය සඳහා රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචිව සිටින සමුපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති, කම්කරු සමිති සහ පුද්ගලික කොන්ත්‍රාත් කරුවන්ගෙන්ද 1969 ජූලි 20 වන දින පෙ. ව. 11 දක්වා අම්පාර දිසාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

අංක 34 ජනපදයේ ජනපද නිලධාරි නිවාසයට වතුර ටැංකියක් බැඳීම.

2. දිවයිනේ පිහිටි ඕනෑම කච්චේරියක එම වැඩය වෙනුවෙන් රු. 10 ක ටෙන්ඩර තැන්පත් මුදලක් අම්පාර දිසාපති නමින් තැන්පත් කොට ලබාගත් නිල කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර පෝර්ම අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක. ඉහත පළමුවන ජේදයේ සඳහන් සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අවශ්‍ය නැත. ටෙන්ඩර පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර දින ප. ව. 1 දක්වා ටෙන්ඩර පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. පිටපත් දෙකකින් යුක්තව පැහැදිලි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ටෙන්ඩර පෝර්ම දිසාපති, ලේකම් කාර්යාලය, අම්පාර යන ලිපිනයට ලැබෙන සේ ලේඛණ ගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර පෙට්ටියේ ඒවා තැන්පත් කළ යුතුය. ටෙන්ඩර පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "අංක 34 ජනපදයේ ජනපද නිලධාරි නිවාසයට වතුර ටැංකියක් බැඳීම සඳහා ටෙන්ඩර" යන්න සඳහන් කළ යුතුය. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති හෝ නොපැහැදිලිව ලියා ඇති හෝ ටෙන්ඩර පත්‍ර සලකා බැලීම පිණිස භාරගනු නොලැබේ.

4. 1969 ජූලි 29 වන දින පෙ. ව. 11 ට අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ දී ටෙන්ඩර පත්‍ර විවෘත කරනවා ඇත. එසේ ටෙන්ඩර විවෘත කරන අවස්ථාවේ දී එම ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩර කරුවන්ට හෝ ඔවුන්ගෙන් ලිපියකින් බලය ලත් නියෝජිතයෙකුට ඉඩ දෙනු ලැබේ.

5. තෝරාගත් ටෙන්ඩර කරු ඒ බව ඔහුට දැනුම් දෙන ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කොට සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම පිණිස අම්පාර දිසාපති සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ඇපය තෝරාගත් ටෙන්ඩර පත්‍රයේ සඳහන් මුදලින් සියයට 5 කට නොවැඩි මුදලක් වනු ඇත. මෙසේ මෙම ගිවිසුමට ඇතුලත් වීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ නම "වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට" ඇතුළත් කරනවා ඇත. තවද ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදලද ආපසු ගෙවනු නොලැබේ.

6. වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත් කරුවකු ලෙස රජය පිළිගත් අයෙකු බව හෙලිවීම හෝ තමාට සැහේයයි පෙනීයන වෙනත් හේතුවක් හෝ නිසා මෙම සේවාව පැවරීමට එම අවස්ථාවේදී නුසුදුස්සකුයයි අම්පාර දිසාපතිට ඒත්තු යන කවර හෝ පුද්ගලයෙකු නැතහොත් සමිතියක් සමග වුවද මෙකී ගිවිසුමට ඇතුළත් වීම එම දිසාපතිගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී ප්‍රතික්ෂෙප කළ හැකිය.

7. ටෙන්ඩර කාර සමිතිවල ස්ථිරත්වය සහ ක්‍රියාකාරී පැවැත්ම පිළිබඳව ග්‍රාමසංවර්ධන සහකාර අධ්‍යක්ෂ, සමුපකාර සංවර්ධන උප කොමසාරිස්, හෝ කම්කරු උප කොමසාරිස් යන නිලධාරීන් අතුරින් අදාල නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර පත්‍රයට අමුණා එවිය යුතුය. එකී සමිතිය මෙම කොන්ත්‍රාත්තුව පැවරීමට සුදුසු එකක්ද යන බවට එම නිලධාරියාගේ නිර්දේශයද එම සහතිකයට ඇතුළත් විය යුතුය.

8. යම්කිසි ටෙන්ඩරයක් මුළුමනින් හෝ කොටස් වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ නැතහොත් පිළිගැනීමේ සම්පූර්ණ අයිතිය අම්පාර දිසාපති සතුව පවතී.

9. ටෙන්ඩර පෝර්ම ලබාගත් නමුත් ඒවා සම්පූර්ණ කොට අම්පාර දිසාපති වෙත ඉදිරිපත් නොකළ අයගේ සහ නියමිත කොන්දේසි වලට පටහැනිව ටෙන්ඩර පත්‍ර ඉදිරිපත් කිරීම නිසා නොපිළිගත් ටෙන්ඩරපත්‍ර එවූ අයගේද ටෙන්ඩර තැන්පත් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

10. මේ පිළිබඳව වැඩ විස්තර සහ කොන්ත්‍රාත් කරු ඇතුළත් විය යුතු ගිවිසුමේ කොන්දේසි පිළිබඳව අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් සාමාන්‍ය කාර්යාල කටයුතු කරන වේලාවකදී විමසා දැන ගත හැක.

සී. නාරායනසාමි,
අම්පාර දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1969 ක්වූ ජූනි මස 26 වැනි දින,
අම්පාර දිසාපති කාර්යාලයේ දීය.

7–174—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඉආ/1/238.

## අම්පාර කච්චේරිය

පහත සඳහන් වැඩ සඳහා රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචිව සිටින සමුපකාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති, කම්කරු සමිති සහ පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්ද 1969 ජූලි 29 වන දින පෙ. ව. 11 දක්වා අම්පාර දිසාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ. එක් එක් වැඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩරපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

(1) අංක 5 ජනපදයේ ජනපද නිලධාරි නිවාසය අලුත්වැඩියා කිරීම.

(2) පාලම්කඳවුර ජනපද නිලධාරී නිවාසය අලුත්වැඩියා කිරීම.

(3) අංක 34 ජනපදයේ ජනපද නිලධාරි නිවාසය අලුත්වැඩියා කිරීම.

2. දිවයිනේ පිහිටි ඕනෑම කච්චේරියක එක් වැඩක් වෙනුවෙන් රු. 10 ක ටෙන්ඩර තැන්පත් මුදලක් අම්පාර දිසාපති නමින් තැන්පත් කොට ලබාගත් නිල කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර පෝර්ම අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක. ඉහත පළමුවන ඡේදයේ සඳහන් සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අවශ්‍ය නැත. ටෙන්ඩර පත්‍ර භාර ගන්නා අවසාන දිනට පෙර දින ප. ව. 1 දක්වා ටෙන්ඩර පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. පිටපත් දෙකකින් යුක්තව පැහැදිලි ලෙස පුරවා සම්පූර්ණ කරන ලද ටෙන්ඩර පෝර්ම දිසාපති, ලේකම් කාර්යාලය, අම්පාර යන ලිපිනයට ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර පෙට්ටියේ ඒවා තැන්පත් කළ යුතුය. ටෙන්ඩර පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "………(වැඩයේ නම)………සඳහා ටෙන්ඩර" යන්න

සඳහන් කළ යුතුය. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති හෝ නොපැහැදිලිව ලියා ඇති හෝ ටෙන්ඩර පත්‍ර සලකා බැලීම පිණිස භාරගනු නොලැබේ.

4. 1969 ජූලි 29 වන දින පෙ. ව. 11ට අම්පාර දිසාපති කාර්යාලයේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ දී ටෙන්ඩර පත්‍ර විවෘත කරනවා ඇත. එසේ ටෙන්ඩර විවෘත කරන අවස්ථාවේ දී එම ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩරකරුවන්ට හෝ ඔවුන්ගෙන් ලිපියකින් බලය ලත් නියෝජිතයෙකුට ඉඩ දෙනු ලැබේ.

5. පිලිගත් ටෙන්ඩරකරු ඒ බව ඔහුට දැනුම් දෙන ලිපියේ සඳහන් දින සිට දින 14 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කොට සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම පිණිස අම්පාර දිසාපති සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. ඇපය ජයග්‍රාහක ටෙන්ඩර පත්‍රයේ සඳහන් මුදලින් සියයට 5 කට නොවැඩි මුදලක් වනු ඇත. මෙසේ මෙම ගිවිසුමට ඇතුලත් වීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ නම "වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට" ඇතුලත් කරනවා ඇත. තවද ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදලද ආපසු ගෙවනු නොලැබේ.

6. වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවකු ලෙස රජය පිළිගත් අයෙකු බව හෙලිවීම හෝ තමාට සෑහේයයි පෙනීයන වෙනත් හේතුවක් හෝ නිසා මෙම සේවාව පැවරීමට එම අවස්ථාවේදී නුසුදුස්සකු යයි අම්පාර දිසාපතිට ඒත්තු යන කවර හෝ පුද්ගලයෙකු නැතහොත් සමිතියක් සමග වුවද මෙකී ගිවිසුමට ඇතුළත් වීම එම දිසාපතිගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී ප්‍රතික්ෂේප කළ හැකිය.

7. ටෙන්ඩරකාර සමිතිවල ස්ථිරත්වය සහ ක්‍රියාකාරී පැවැත්ම පිළිබඳව ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ, සමුපකාර සංවර්ධන උප කොමසාරිස් හෝ කම්කරු උප කොමසාරිස් යන නිලධාරීන් අතුරින් අදාල නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර පත්‍රයට අමුණා එවිය යුතුය. එකී සමිතිය මෙම කොන්ත්‍රාත්තුව පැවරීමට සුදුසු එකක්ද යන බවට එම නිලධාරියාගේ නිර්දේශයද එම සහතිකයට ඇතුළත් විය යුතුය.

8. යම්කිසි ටෙන්ඩරයක් මුළුමණින් හෝ කොටස් වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ නැතහොත් පිළිගැනීමේ සම්පූර්ණ අයිතිය අම්පාර දිසාපති සතුව පවතී.

9. ටෙන්ඩර පෝර්ම ලබාගත් නමුත් ඒවා සම්පූර්ණ කොට අම්පාර දිසාපති වෙත ඉදිරිපත් නො කළ අයගේ සහ නියමිත කොන්දේසි වලට පටහැනිව ටෙන්ඩර පත්‍ර ඉදිරිපත් කිරීම නිසා නොපිළිගත් ටෙන්ඩර පත්‍ර එවූ අයගේ ද ටෙන්ඩර තැන්පත් මුදල් ආපසු ගෙවනු නො ලැබේ.

10. මේ පිළිබඳ වැඩි විස්තර සහ කොන්ත්‍රාත්කරු ඇතුළත් විය යුතු ගිවිසුමේ කොන්දේසි පිළිබඳවද අම්පාර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් සාමාන්‍ය කාර්යාල කටයුතු කරන වේලාවකදී විමසා දැනගත හැක.

සී. නාරායනසාමි,
අම්පාර දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති.

1969 ක්වූ ජූනි මස 26 වැනි දින,
අම්පාර දිසාපති කාර්යාලයේ දීය.

7–173—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ මහ රෝහලේ බාහිර රෝගින්ගේ අංශය ප්‍රතිසංවිධානය කිරීම (පියවර 3 ඒ) සඳහා වූ ටෙන්ඩර් පත් කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ගොඩනැගිලි අධිකාරි ඉංජිනේරු කායඝිලයේ ටෙන්ඩර් මංඩලයේ සභාපතිවරයා විසින් වෂී 1969 ක් වූ ජූලි මස 23 වැනි බදාදා පෙරවරු 10.30 මන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොළඹ ගොඩනැගිලි විධායක ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර සැලැස්ම ද ඔහුගේ කායඝිලයේ දී බලාගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 36,000 කට නො අඩු ගණනකට ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 10 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වෂී 1969 ක් වූ ජූලි මස 11 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිළධාරිතැන වෙත ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. නඩරාජා,
අධිකාරි ඉංජිනේරු, ගොඩනැගිලි.

කොළඹ 7,
ගොඩනැගිලි අධිකාරි ඉංජිනේරු කායඝිලයය,
1969 ජූනි මස 26 දින.

7–100–69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

සත්තලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී නිවාස ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුරයේ ර. වැ. දෙ., උ. මැ. කො. ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වෂී 1969 ජූලි 30 වැනි බදාදා ප. ව. 2.30 තෙක් භාරගනු ලැබේ.

2. ත්‍රිකුණාමලයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායඝිලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 36,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වෂී 1969 ජූලි මස 18 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඝිලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇම්. ආර්. ප්‍රනාන්දු,
අධිකාරී ඉංජිනේරු, උ. මැ. පළා.

අධිකාරී, ඉංජිනේරු කායඝිලය,
අනුරාධපුරය,
1969 ජූනි මස 25 දින.

7–147—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ර. වැ. දෙ. හලාවත දිස්ත්‍රික්කයේ කොළඹ-පුත්තලම් පාරේ අංක 52/5 දරන ඇඳුරු ඔය පාලමට 6"×9" සක්කගල් කියුබ් 150 2" කළු ගල් කියුබ් 800 සහ ½ කළුගල් කියුබ් 545 ක් සැපයීමට හා භාරදීම සඳහා ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගනු ලබන්නේ, 1969. 7. 24 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 11 තෙක් කොළඹ 1, ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසිනි.

2. රත්මලානේ ර. වැ. දෙ. පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරුගේ කාර්යාලයෙන් ලබාගත් ටැන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත්‍ර, පිටපත් දෙක කින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. ඔහුගෙන් සියළු විස්තර ලබාගත හැක.

3. ටෙන්ඩර් පත් නිකුත් කරන්නේ, ටෙන්ඩර්කරුවන් විසින් රු. 200 ක මුදල් තැන්පත් කර, ඒ පිළිබඳ කුවිතාන්සිය 69.7.14 වෙනි සඳුදින පස්වරු 4.30 ට පෙර පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළවිටයි. දිනකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින් ආපසු නොගෙවනු ලබන ප්‍රමාද ගාස්තුවක්, නිකුත් කරන නිලධාරියාට ගෙවා, ඊට කුවිතාන්සිය ලබාගෙන ඒ අනුව ප්‍රමාද වූ ඉල්ලුම්කරුවන් විසින් ටැන්ඩර් පිළිබඳ ඉල්ලුම් පත් ලබා ගත හැක.

4. ටෙන්ඩර් වෙනුවෙන් මුදල් තැන්පත් කළ හැක්කේ කොළඹ කොටුවේ ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකදීය.

එස්. නාගලිංගම්,
පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු.

පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
ර. වැ. දෙ., රත්මලාන.

7–158—69.7.4 දන අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**1969 මාර්තු සිට මැයි දක්වා ටෙන්ඩර් පිළිබඳ අවසාන තීරණ**

| සේවා විස්තර | ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් ගාස්තුව |
|---|---|---|---|
| **1969 මාර්තු** | | | |
| විනාඩියට ගැලුම් 25 ක ප්‍රමාණයේ වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩරය | 5 | ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරන ලදී. | |
| පදවියේ දි.ඉ.නි. ආයතනයට වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩරය... | 2 | සී.ස. හැරිසන්ස් ලිස්ටර් එංජිනියරිං, තැ.පෙ. 69, කොළඹ | රු.2,980 0 |
| ඌරුබොක්ක–කටුවානපාරෙහි පාලමක් තැනීම සඳහා ටෙන්ඩරය ... | 1 | හෙට්ටිගේ සහෝදරයෝ, මුලටියන හංදිය ... | රු.49,461 0 |
| **1969 අප්‍රියෙල්** | | | |
| කිසිවෙක් නැත. | | | |
| **1969 මැයි** | | | |
| ට්‍රැක්ටර් 10 හා ට්‍රෙලර් 10ක් සැපයීම සඳහා ටෙන්ඩරය ... | 4 | (ඒ) සී.ස. සිලෝන් සර්විස් ඇන්ඩ් සප්ලයිස් සමාගම, කොළඹ 2, | |
| | | ඉන්ටර් නැෂනල්, මොඩ්ල් 624, ට්‍රැක්ටර් 5යි... | ප්‍රැන්ක් 86,400 |
| | | ඉන්ටර් නැෂනල්, මොඩ්ල් 12/53, ටරේලර්ස් 10 | 57,029 |
| | | (බී) සී.ස. බ්‍රවුන් සහ සමාගම, තැ.පෙ. 200, කොළඹ, මැසි පර්ගියුසන් මොඩ්ල් 135, ට්‍රැක්ටර් 5යි ... | ප්‍රැන්ක් 56,650 |
| | | මෙරට වියදම් ... ... | රු.7,590 0 |
| හුලංකන්ද—කලුපහන පාර තැනීමේ ටෙන්ඩරය ... ... | 2 | ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරන ලදී. | |
| 2" පොම්ප 20ක් සැපයීම සඳහා ටෙන්ඩරය ... ... | 18 | කොන්ට්‍රැක් ඇන්ඩ් සප්ලයිස් සමාගම, තැ.පෙ. 487, කොළඹ | රු.32,500 0 |
| විනාඩියට ගැලුම් 10ක ප්‍රමාණයේ විදුලියෙන් ක්‍රියා කරන පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩරය | 8 | බී.සී. බයර්ස්, තැ.පෙ. 1613, කොළඹ ... (ආනයනයකර සැපයීම සඳහා) | 893 38 |
| විනාඩියට ගැලුම් 85ක ප්‍රමාණයේ වතුර පොම්ප 2ක් සැපයීම සඳහා ටෙන්ඩරය | 14 | බී.සී. බයර්ස්, තැ.පෙ. 1613, කොළඹ ... (ආනයනය කර සැපයීම සඳහා) | 5,069 96 |
| ගල් විදිනයන් 10ක් සැපයීම සඳහා ටෙන්ඩරය ... ... | 12 | ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කරන ලදී. | |
| අනුරාධපුරයේ සංචාරක නිවාසයේ විදුලිය ස්ථාපනය කිරීමේ ටෙන්ඩරය ... | 1 | ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කරන ලදී. | |

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1969.6.24.

7–146—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—බටහිර දිසාව

**දැව වෙන්දේසිය**

ඝන අඩි 10.6 කින් යුත් මීල්ල කඳන් තොග 1 ක්, ඝන අඩි 5.0කින් යුත් කීන ඉරාපු ලෑලි තොග 1 ක් සහ තොග 13 කින් යුත් ඉරන කියත්, හරස් කියත්, පොරෝ, වෑ, පිහිය, දැත් අඬු සහ බන්ඩි කියත් යනාදී ද්‍රව්‍ය රාශියක් රත්නපුර දිසා වන නිලධාරී විසින් 69. 7. 27 දින පෙරවරු 10 ට මතුගම අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම ආයුධ සහ දැව මතුගම අඩවි වන නිලධාරි කාර්යාලයේ ඇත. ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අයහට ඒ ඒ ද්‍රව්‍ය වෙන්දේසියට ප්‍රථම පරීක්ෂාකර බලා සෑහීමකට පත්විය හැක. වෙන්දේසිය පිළිබඳව වැඩි විස්තර රත්නපුර දිසා වන නිලධාරිගෙන් හෝ මතුගම අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

එස්. එන්. යූ. ප්‍රනාන්දු,
දිසා වන නිලධාරි,
බටහිර දිසාව.

දිසා වන කාර්යාලය,
රත්නපුර.

7–162--69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

# තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## 1969–70 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1969 ජූනි මස 20 වැනි දින අංක 14,859 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන විදේශීය මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප වශයෙන් රු. 300 ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග, සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබාගත් නියමිත ටෙන්ඩර් පෝර්මයක ඉදිරිපත් කළ යුතුය.

3. (i) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැන ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් හෝ එයට විකල්පයක් වශයෙන් විශ්වාස සහතික ඔප්පුවක් (FIDELITY, GURANTEE BOND) ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. වත්කම් සහතිකයේ හෝ විශ්වාස සහතික ඔප්පුවේ වටිනාකම ඔවුන් විසින් එක් එක් තැබෑරුමකට ඉදිරිපත් කරනු ලබන මුදලේ වටිනාකමෙන් සියයට විසිපහකට (25) වඩා අඩු නොවිය යුතුය.

(ii) එක් වත්කම් සහතිකයක් හෝ විශ්වාස සහතික ඔප්පුවක් රේන්ද කීපයක් අපේක්ෂා කරන ටෙන්ඩර්කරුවකු විසින් ඉදිරිපත් කළ හැකිය. එවැනි අවස්ථාවලදී එක් එක් ටෙන්ඩර් පත්‍රයට වත්කම් සහතිකයේ මුල් පිටපත හා එහි සහතික කළ පිටපතක් අමුණා තැබිය යුතුය.

(iii) වත්කම් ඇතුවෙන සහතිකයට ගැනෙන දේපල සහතික ලබාගත් පසු විකිණීම හෝ වෙනත් අන්දමකින් අයිතිය වෙනස් කිරීම රේන්දයේ කොන්ත්‍රාත්තුව දෙන ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමක් හැටියට සලකනු ලැබේ.

4. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු අතර නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1969 ජූනි මස 20 වැනි දින අංක 14,859 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969–70 වර්ෂයට විදේශීය මත්පැන් තැබෑරුම් රේන්දය විකිණීමේ කොන්දේසි අංක 6 යටතේ නුසුදුසු වූවන්ගේ ටෙන්ඩර් භාරගනු නොලැබේ.

5. එක තැබෑරුමක් වෙනුවෙන් එක් අයකු විසින් එක ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි වන අතර පස් දෙනෙකුට වඩා හවුල්ව ද ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

6. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවර වම්පස මුදුනේ ''කළුතර දිස්ත්‍රික්කයේ අංක..................දරන විදේශීය මත්පැන් තැබෑරුම් රේන්දය සඳහා ටෙන්ඩර් 1969–70'' යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුයි.

(අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ;

(ආ) ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ;

1969 ජූලි මස 29 වැනි දින පහත දක්වෙන උපලේඛනයේ සඳහන් ටෙන්ඩර් භාරගැනීම පවත්වන වේලාවට පෙර සියලුම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එම වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුය. මෙහි 4 ඡෙදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් එය සනාථ කිරීමේ ලියවිලි ද රැගෙන පැමිණිය යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිගත් බවට දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතුය.

8. ටෙන්ඩර්පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති වෙත පැවරී ඇත. රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

9. 1969–70 වර්ෂයට දැනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කළහොත් ඒ සම්බන්ධයෙන් කළුතර දිසාපතිතැනගේ අනුමැතිය ලබාගත යුතුය.

10. වැඩි විස්තර කළුතර දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 27 දින,
කළුතර දිසාපති කාර්යාලයේදී ය.

### 1969–70 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද මත්පැන් තැබෑරුම් ලැයිස්තුව

| අනුපිළිවෙල අංකය | කොට්ඨාශය | ප්‍රාදේශීය ප්‍රදේශය | තැබෑරුම් විවෘත කරන වේලාව | තැබෑරුම් වසන වේලාව | ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|
| 1. | හොරණ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය | හොරණ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ ... | පෙ.ව. 8.00 ... | ප.ව. 8.00 ... | ප.ව. 1.30 |
| 2. | පස්දුන් කෝරලය (බටහිර) ... | නෑබඩ ගම්සීමාව තුළ ... | පෙ.ව. 8.00 ... | ප.ව. 7.30 ... | ප.ව. 2.00 |
| 3. | පස්දුන් කෝරලය (බටහිර) ... | තෙබුවන ගම්සීමාව තුළ ... | පෙ.ව. 8.00 ... | පෙ.ව. 7.30 ... | ප.ව. 2.30 |

7–166—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ අරක්කු තැබෑරුම් විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම්වල අරක්කු සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා 1969 ජූනි මස 6 වැනි දින අංක 14,857 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1969–70 වර්ෂය සහ ඊට පසු කාලපරිච්ඡෙදයන් සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවලටද දැනට බලපවත්නා සියළුම සුරාබදු කොන්දේසිවලටද සහ පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 1969 ජූලි මස 20 වැනි දින තෙක් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

2. අරක්කු රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත්වන අය ලංකාවේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාර සම්පූර්ණකර මෙහි පහත දක්වා ඇති අනුමත අරක්කු තැබෑරුම් ලැයිස්තුවෙහි නියමකර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කච්චේරි කුවිතාන්සියද ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක්ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි ක්‍රමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය හා නමද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි පහත දක්වෙන ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචිකළ තැපෑලෙන් එවීමෙන් හෝ මෙම කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිසාපති තුමා වෙත ලැබීමට සැලැස්විය යුතුයි.

3. ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම හෝ සංශෝධනයක්ම ටෙන්ඩර් කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුයි. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 1969 ජූලි මස 20 වැනි දින පෙරවරු 9 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියේ පෙනී සිටිය යුතුයි.

5. කිසියම් කරුණක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති තුමා සතුවේ.

6. ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ අය ඔහු ගැණුම්කරු වශයෙන් ප්‍රකාශිත දින දිසාපති තුමා විසින් නියම කරනු ලබන මාස දෙකකට නොඅඩු කාලයක බද්ද මුදලක් තැන්පත් ඇප වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තැබිය යුතුයි.

7. 1969–7 වර්ෂය සඳහා දනට අරක්කු තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකිවේදැයි කිව නොහැක. සෑම ස්ථානයක්ම, කුරුණෑගල දිසාපති තුමාගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන විය යුතුයි.

8. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමේදී දනගත යුතු වෙනත් විස්තර ඇත්නම් කුරුණෑගල කච්චේරියෙන් ලබාගත යුතුයි.

හී. බ. දිසානායක,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති තුමා.

1969 ජූනි මස 23 වැනි දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දීය.

උපලේඛනය

අනුමත කරන ලද අරක්කු තැබෑරුම් ලැයිස්තුව—කුරුණෑගල දිස්ත්‍රික්කය

| තැබෑරුමේ අංකය හා නම | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|
| 1. කට්ටිමහන | කටුගම්පොල හත්පත්තුව | කට්ටිමහන ගම තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 |
| 2. දූනකදෙනිය | කටුගම්පොල හත්පත්තුව | දූනකදෙනිය ගම තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 |
| 3. යක්විල | කටුගම්පොල හත්පත්තුව | යක්විල ගම තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 |
| 4. කුරුණෑගල | කුරුණෑගල නගර සභාව | කුරුණෑගල නගර සභා සීමාවේ අංක 2,3,4,5,6,8, හා 9 යන කොට්ඨාශ තුළ එහෙත් එස්ප්ලෙන්ඩ් වීදිය හා මහ වීදියත් බස් නැවතුම්පලට යාබදව ඇති පාරවල්වලටත් පිටස්තරව පිහිටා ඇති ස්ථානයක | පෙ.ව. 8.00 | ප.ව. 8.00 |
| 5. මාවතගම | වැඩවිල්ලි හත්පත්තුව | මාවතගම ගම තුළ | පෙ.ව. 8.00 | ප.ව. 8.00 |
| 6. ගිරිඋල්ල | කටුගම්පොල හත්පත්තුව | මල්ගමුව ගම තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 |
| 7. නාරම්මල | දඹදෙනි හත්පත්තුව | නාරම්මල සුළු නගරය තුළ | පෙ.ව. 8.00 | ප.ව. 7.00 |

ටෙන්ඩර් තැන්පත්මුදල සහ ටෙන්ඩර් වසන වේලාව

| තැබෑරුමේ නම හා අංකය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | ටෙන්ඩර් වසන වේලාව |
|---|---|---|
| 1. කට්ටිමහන | 500 0 | පෙ.ව. 9.00 |
| 2. දූනකදෙනිය | 500 0 | පෙ.ව. 9.30 |
| 3. යක්විල | 500 0 | පෙ.ව. 10.00 |
| 4. කුරුණෑගල | 4,000 0 | පෙ.ව. 10.30 |
| 5. මාවතගම | 1,000 0 | පෙ.ව. 11.00 |
| 6. ගිරිඋල්ල | 1,000 0 | පෙ.ව. 11.30 |
| 7. නාරම්මල | 1,000 0 | පෙ.ව. 12.00 |

7–52—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂයට අම්පාර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

වර්ෂ 1969 ඔක්තෝම්බර් මස 1 වැනි ද සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි ද දක්වා කාලය තුළ පහත දක්වෙන තැබෑරුම් අරක්කු සිල්ලරට විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසි වලට යටත්ව භාරගනු ලැබේ.

(අ) 1969 ජූනි මස 6 වැනි දින අංක 14,857 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද 1969–70 වර්ෂයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි සහ,

(ආ) සෑම සුරා බද්ද බලපත්‍රයක් සඳහාම බල පවත්වන සාමාන්‍ය කොන්දේසි.

2. පහත සඳහන් වන තැබෑරුම සඳහා රු. 3,000ක ටෙන්ඩර් තැන්පත් මුදලක්, ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය. තව ද එක් එක් ටෙන්ඩර්පත්‍රය සමඟ රේන්දයේ වටිනාකමින් සියයට විසිපහක (25%) ට නොඅඩු වත්කමක් ඇති බවට තමාගේ නිශ්චල දේපල ඉඩකඩම් පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. වත්කම් හඟවන සහතිකයට ගැණෙන දේපොල සහතික ලබාගැනීමෙන් පසු විකිණීම හෝ වෙනත් අන්දමකින් අයිතිය වෙනස් කිරීම, රේන්දයේ කොන්ත්‍රාත්තුවට දෙන ගිවිසුමේ කොන්දේසි කඩ කිරීමක් හැටියට සලකනු ලැබේ.

3. ලංකාවේ සෑම කච්චේරියකින්ම හෝ කොළඹ සුරාබද්ද කාර්‍යාලයෙන් හෝ මඩකලපුවේ සුරාබද්ද අධිකාරිතැනගේ කාර්‍යාලයෙන් හෝ ත්‍රිකුණාමලයේ සහකාර සුරාබද්ද කොමසාරිස්තැනගේ කාර්‍යාලයෙන් හෝ ලබා ගත් ආකෘති පත්‍ර වල ලියන ලද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

4. 1969 අගෝස්තු මස 1 වැනි සිකුරාද මෙහි පහත දක්වා ඇති පරිදි භාරගැනීමේ අවසන් වේලාවට ප්‍රථමයෙන් ටෙන්ඩර්පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසන් වේලාව වන විට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියට පැමිණ සිටිය යුතු ය. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අම්පාර කච්චේරියට පැමිණ ලබා ගත හැකි ය.

වී. සී. බී. උනන්තැන්න,
අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 21 වැනි දින,
අම්පාර දිසාපති කාර්‍යාලයේ දීය.

සඳහන් කරන ලද ප්‍රදේශ

රේන්ද ප්‍රදේශය—අම්පාර දිස්ත්‍රික්කය

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවියයුතු ප්‍රදේශය | ටෙන්ඩර්පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|
| 1 | කරවාහු පත්තුව | පෙරිය නීලවනෙයි ග්‍රාමය | පෙරවරු 10.00 |

7–24—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## 1969–70 වර්ෂය සඳහා යාපනය දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද වෙන්දේසිය

1969 ඔක්තෝබර් 1 වෙනිද සිට 1970 සැප්තැම්බර් 30 දක්වා වූ කාලය තුළ පහත දක්වා ඇති තැබෑරුම්වලදී සිල්ලර ප්‍රමාණයෙන් අරක්කු විකිණීමේ අයිතිය මිළයට ගැනීම ඉල්ලුම් කරන ටෙන්ඩර් පත්‍රය පහත සඳහන් වන වගන්තිවලට විෂයට මෙයින් කැඳවනු ලැබේ :—

(i) 1969 ජූනි මස අංක 14,857 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අරක්කු රේන්දය විකිණීමේ කොන්දේසි;

(ii) දැනට භාවිතා වන සෑම සුරාබදු බලපත්‍රවලට අදළ පොදු කොන්දේසි ;

2. සෑම ටෙන්ඩර් ඉල්ලුම් පතක්ම අංක 1 දරණ ග්‍රෑන්ඩ් බසාර්, අංක 2 දරණ කරයූර්, අංක 3 දරණ වැල්වැටිතුරේ, අංක 4 දරණ කයිට්ස් සහ අංක 5 දරණ වන්නාන්කර්ණි යන තැබෑරුම් එක එකක් වෙනුවෙන් රු. 5,000ක ටෙන්ඩර් තැන්පත් මුදලක් සඳහන් භාණ්ඩාගාර හෝ කච්චේරි කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත් නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතුය.

3. සෑම ටෙන්ඩරයක්ම බහාලන කවරය සීල් තැබිය යුතු අතර එහි ඉහළ කෙළවර වම්පස, මෙසේ සඳහන් කළ යුතුය—'' යාපනය දිස්ත්‍රික්කයේ 1969–1970 වර්ෂයට අංක 1 දරණ ග්‍රෑන්ඩ් බසාර්, අංක 2 දරණ කරයූර්, අංක 3 දරණ වැල්වැටිතුරේ, අංක 4 දරණ කයිට්ස්, අංක 5 දරණ වන්නාර්කර්ණි අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩරයයි ''. පහත සඳහන් ඕනෑම තැබෑරුමක් සඳහා වූ බහාලන ලද සීල් තැබූ කවරය—

(අ) කච්කච්රියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළයුතුයි ; නැතහොත්

(ආ) ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට අවසන් කිරීමට නියමිත වේලාවට පෙර ලැබෙන ලෙස යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන වෙත එවිය යුතුයි.

එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. සියළුම තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම 1969 ජූලි මස 17 වන දින එක් එක් තැබෑරුම් වෙනුවෙන් පහත දක්වා ඇති වේලාවල්වලදී අවසාන වේ :—

(අ) අංක 1 අරක්කු තැබෑරුම—ග්‍රෑන්ඩ් බසාර් : පෙ.ව. 9.30

(ආ) අංක 2 අරක්කු තැබෑරුම—කරයූර් : පෙ.ව. 10

(ඇ) අංක 3 අරක්කු තැබෑරුම—වැල්වැටිතුරේ : පෙ.ව. 10.30

(ඈ) අංක 4 අරක්කු තැබෑරුම—කයිට්ස් : පෙ.ව. 11

(ඉ) අංක 5 අරක්කු තැබෑරුම—වන්නාන්කර්නි : පෙ.ව. 11.30

ටෙන්ඩර්කරුවන් 1969 ජූලි මස 17 වැනි බ්‍රහස්පතින්ද පෙ.ව. 9 ට මෙම කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

4. (අ) සෑම ටෙන්ඩර්කරුවකු විසින්ම සෑම තැබෑරුමක් සඳහා ඉල්ලුම් කරන ලද මුදලෙන් සියයට 25කට නොඅඩු ප්‍රමාණයකට සමාන වටිනාකමක් ඇති වටිනාකමේ සහතිකයක් හෝ විශ්වාස සහතික කිරීමේ ඇප ඔප්පුවක් ඉදිරිපත් කළයුතුයි. ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීතැනගෙන් වටිනාකමේ සහතිකය ලබා ගතයුතුය. එක දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්ක කීපයක තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමග වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇතිනම් අනිකුත් ටෙන්ඩර්වලට එම සහතිකයේ සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැව් ටෙන්ඩරයට අදළ තැබෑරුමේ නම, අංකය සහ එය පිහිටි දිස්ත්‍රික්කය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

(ආ) පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද වටිනාකම් සහතිකයේ සඳහන් දේපල හෝ ඉන් කොටසක් මගේ කලින් ලේඛිත අනුමැතියක් නොමැතිව විකුණුවහොත්, උකස් තැබුවහොත් අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි කඩකිරීමක් වනු ඇත.

(ඇ) සමූහ වශයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කරන කල්හි ටෙන්ඩර් කොන්දේසිවලට සරිලන සේ නිශ්චල දේපල සම්බන්ධයෙන් වටිනාකමේ සහතිකය එක් අයකු හෝ වැඩි දෙනකු විසින් ඉදිරිපත් කළයුතුය.

5. ටෙන්ඩර් හිමියන් අයිතිවාසිකම් ලැබීමට තෝරා ගනු ලැබූ බව දන්වීමෙන් පසු විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබිය යුතු වන අතර ආණ්ඩුවේ ඒජන්තවරයකු විසින් නියම කරන ඇප මුදලක් ආණ්ඩුවේ ඒජන්තතැන වෙත තැන්පත් කළයුතුය.

6. ටෙන්ඩර් හිමියකු ඉහත සඳහන් තැබෑරුම්වල අරක්කු විකිණීමට මිළයට ගන්නකු වශයෙන් ප්‍රකාශ කළ පසුව වෙන්දේසියේ කොන්දේසිවලට අත්සන් කිරීම පැහැර හරින්නේ නම් හෝ ඇප මුදල තැන්පත් කිරීමට නියම කළ විට එයට අපොහොසත් වන්නේ නම් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ඉල්ලීමේ ඇප මුදල රාජසන්තක වන්නේ ය. සියළුම සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් ඔහුගේ නම අණ කඩකළවුන්ගේ නාම ලේඛණයට ඇතුළත් වනවා ඇත. මෙය විශේෂයෙන්ම යටත්ව තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවකු විසින් වෙන්දේසියේ කොන්දේසිවල අත්සන් කිරීමෙන් හා ඉහත සඳහන් වූ ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු ඔහුගේ තැන්පත් මුදල ආපසු භාර දෙනු ලැබේ.

7. ලංකාවේ පුරවැසියකු නොවන්නකු විසින් හෝ ඉහත සඳහන් රේන්ද විකිණීමේ 5 වැනි හා 6 වැනි කොන්දේසිවලින් නුසුදුස්සකු වූවකු හෝ ඉල්ලනු ලබන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

8. යම්කිසි ටෙන්ඩරයක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමට ඇති හේතුව කුමක්දැයි සඳහන් නොකර එසේ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුවේ ඒජන්තතැන වෙත ඇති ඇවුරුම් හිමිකමක් සේ තබා ගන්නවා ඇත.

9. දැනට පවත්නා තැබෑරුම් භූමි භාග 1969–1970 වර්ෂය සඳහා දැනට තැබෑරුම් පවත්වන ස්ථාන ලැබේද යන්න ගැන ස්ථිරතාවයක් නැත. භූමිභාග සඳහා යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැනගේ පූර්වානුමැතිය තිබිය යුතුය.

10. වැඩිදුර විස්තර ඉල්ලුම්පතක් එවීමෙන් යාපනය කච්චේරියෙන් ලබා ගතහැක.

11. අරක්කු තැබෑරුම් විවෘත කරන හා වහන වේලාවල් මෙහි පහත දක්වෙන අයුරු සංශෝධනය කර ඇත :—

| අනු පිළිවෙල අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටිය යුතු ප්‍රදේශය | විවෘත කරන වේලාව පෙ.ව. | වසන වේලාව ප.ව. |
|---|---|---|---|---|
| 1 ... | ග්‍රෑන්ඩ් බසාර්—යාපනය නගර සභාව කොට්ඨාශය, වාට්ටු අංක 14 | යාපනය නගර සභා කොට්ඨාශය, අංක 14 දරණ ස්ටේෂන් වාට්ටුව | 8.00 | ... 8.00 |
| 2 ... | කරයූර්—යාපනය නගර සභා කොට්ඨාශය, වාට්ටු අංක 3, කැතීඩ්‍රල් වාට්ටුව | යාපනය නගර සභා කොට්ඨාශය අංක 3 දරණ කැතිඩ්‍රල් වාට්ටුව | 8.00 | ... 8.00 |
| 3 ... | වැල්වැටිතුරේ—වැල්වැටිතුරේ සුළු නගර සභා අංක 3... | වැල්වැටිතුරේ සුළු නගර කොට්ඨාශයේ අංක 3 දරණ වාට්ටුව | 8.00 | ... 7.00 |
| 4 ... | කයිට්ස්—කයිට්ස් සුළු නගර සභාව ... ... | කයිට්ස් සුළු නගර සභාව සීමාව තුළ ... | 8.00 | ... 8.00 |
| 5 ... | වන්නාර්කර්නි—පච්චිලයිපලි ... ... | වන්නාන්කර්නි ගම තුළ ... ... | 8.00 | ... 6.30 |

යාපනය දිසාපති කාර්යාලයේදී,
1969 ජූනි මස 24 වැනි දින.

එෆ්. සී. පීටර්ස්,
යාපනය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන.

7–99—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

## අරක්කු රේන්ද විකිණීම—රත්නපුර දිස්ත්‍රික්කය—1969–70

1969 ඔක්තෝබර් මාසයේ 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා ඇති කාල සීමාව තුළ මෙහි පහත උප ලේඛනයෙහි දක්වෙන ප්‍රදේශයන්හි, අරක්කු සිල්ලර වශයෙන් විකිණීම පිණිස, පහත දක්වෙන නීතිවලට අනුකූලව ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(i) 1969 ජූනි මස 6 වෙනි දින අංක 14,857 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව ; හා

(ii) සුරාබදු නිවේදනයේ දක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි ම බලපාන පොදු කොන්දේසි මාලාවට යටත්වය.

2. සෑම ටෙන්ඩර්කරුවෙක් විසින්ම ඕනෑම කච්චේරියකින් ලබා ගන්නා ලද නියමිත ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර එවිය යුතුයි. එසේ ඉදිරිපත් කරන සෑම ටෙන්ඩරයක් සමඟම කච්චේරියේ මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් ද අමුණා තිබිය යුතුයි. බලංගොඩ අංක 1 දරණ අරක්කු තැබෑරුම සඳහා නම් රු. 2,000 ක් ද, පින්නවල අංක 2 දරණ අරක්කු තැබෑරුම සඳහා නම් රු. 1,000 ක තැන්පත් කළ යුතුයි.

3. ඉදිරිපත් කරන ටෙන්ඩරය සුරක්ෂිත ලෙස කවරයක බහා සීල් තබා වම් කෙළවර මුදුනේ කුමණ තැබෑරුම සඳහාදැයි පැහැදිලිව සඳහන් කර ටෙන්ඩර් වහන නියමිත වේලාවට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. තැපැලෙන් එවන්නේ නම්, '' රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන, රත්නපුර '' යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. නැතහොත් කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුයි.

4. සෑම ටෙන්ඩර්කරුවෙක්ම තමාගේ නමින්ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. නියෝජිතයන්ගේ මාර්ගයෙන් හෝ ලාංකික නොවන අයගේ නමින් අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 වැනි කොන්දේසිය අනුව නුසුදුස්සෙකු වූ අයගේ නමින් හෝ ටෙන්ඩර් පිළිගනු නොලැබේ.

5. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවළුන් විසින් ද ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

6. ටෙන්ඩරයේ මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් දක්විය යුතුය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් වීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යොදා සහතික කළ යුතුය. මේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. තෝරා ගත් ටෙන්ඩර්කරු, මිළදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින්ම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා, දිසාපති තැන විසින් නියම කරන ලද මුදල ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි.

8. කිසිදු හේතුවක් නොදක්වා, කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ස්වකීය අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත වෙතට පැවරී ඇත.

9. පහත සඳහන් පරිදි, එක් එක් තැබෑරුමකට නියම කර ඇති වේලාවන්හිදී, 1969 අගෝස්තු 2 වැනි සෙනසුරාද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකී නියමිත වේලාවට කච්චේරියේ පෙනී සිටිය යුතුය.

10. ටෙන්කරුගේ දැනගැනීම සඳහා මෙම දිස්ත්‍රික්කයේ වතුවල තිබෙන කැන්ටින් ලැයිස්තුවක් ද පහත සඳහන් කර ඇත.

11. වැඩි විස්තර රත්නපුර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

අ. පු. බ. මනම්පේරි,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන.

1969 ජූනි මස 19 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| අනුක්‍රමික අංක | කොට්ඨාශය | පිහිටි ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වහන වේලාව | ටෙන්ඩර් වහන වේලාව |
|---|---|---|---|---|---|
| 1. | බලංගොඩ නගර සභා කොට්ඨාශය... | බලංගොඩ නගර සභාවේ අංක 5 දරණ නාගරික කොට්ඨාශය | පූර්වභාග 8.30 ... | අපරභාග 7.30 ... | පූර්වභාග 10.30 |
| 2. | කඩවත සහ මැද කෝරළය ... | පින්නවල ගම ... | ... පූර්වභාග 8.30 ... | අපරභාග 7.00 ... | පූර්වභාග 11.00 |

**වතු කැන්ටින් (ටෙන්ඩර් කිරීම සඳහා නොවේ)**

| | | | |
|---|---|---|---|
| 3. | අටකලන් කෝරළය ... | මාදම්පේ වත්ත ... | ... වත්තේ අධිකාරිගේ මනාපය උඩ පවතී. |

7–7—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 වර්ෂයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

**කාල සීමාව.**—1969 ඔක්තෝබර් මස 1 වන දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා.

අරක්කු තැබෑරුම් විකිණීම සම්බන්ධව 1969 ජූනි මස 6 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ පොදු කොන්දේසිවලට හා දැනට බලපවත්නා සුරාබදු බලපත්‍ර පිළිබඳ පොදු කොන්දේසිවලට යටත්ව, පහත උප ලේඛනයේ දක්වා ඇති අරක්කු තැබෑරුම්වල 1969 ඔක්තෝබර් මස 1 වන දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා වූ කාලය තුල අරක්කු විකිණීමේ සම්පූර්ණ අයිතිය පැවරීම සඳහා ටෙන්ඩර් පත් මවිසින් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම නියමිත ආකෘති පත්‍රයේ එවිය යුතු අතර ටෙන්ඩර් තැන්පත් මුදල වූ රු. 2,000ක් කච්චේරියක තැන්පත් කර ලබාගත් රිසිට් පතක් හා 1969 ජූනි මස 6 වන දින ගැසට් පත්‍රයේ පලවූ පොදු කොන්දේසිවල 4 (3) කොන්දේසිය යටතේ දක්වා ඇති වත්කම් සහතිකයද ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් පත් දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැක.

3. ටෙන්ඩර් පත් අඩංගු සීල් තබනලද කවරයෙහි මුදුනේ වම් කෙළවරේ ටෙන්ඩර් කළ තැබෑරුමේ නමත් එහි අංකයත් පැහැදිලිව ලියා කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. නැතහොත්, ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ දිසාපති, නුවරඑළිය යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත් භාරගැනීම 1969 අගෝස්තු මස 6 වන දින පහත උප ලේඛනයේ එක් එක් තැබෑරුමට ඉදිරියෙන් දක්වා ඇති වේලාවට වසනු ලැබේ. සියළුම ටෙන්ඩර්කරුවන් එම වේලාවට නුවරඑළිය කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. අරක්කු විකිණීමේ සම්පූර්ණ අයිතිය ලද්ද බවට තේරී ප්‍රකාශයට පත්කළ පසුව ටෙන්ඩර්කරු විසින් එදින පස්වරු 4 ට පෙර අරක්කු විකිණීමේ කොන්දේසි පත් අත්සන් කළ යුතු අතර දෙමසක බදු මුදලට නොඅඩු මුදලක් තැන්පත් ඇප වශයෙන් නුවරඑළිය දිසාපතිට ගෙවිය යුතු.

6. කිසියම් කාරණයක් සඳහන් නොකර ටෙන්ඩර් පත් එකක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති සතුවේ.

7. වැඩි විස්තර නුවරඑළිය දිසාපති කාර්‍යාලයෙන් ඉල්ලා සිටිය විට ලබාගත හැක.

පී. ඇම්. විජේකෝන්,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 24 දින,
නුවරඑළිය දිසාපති කාර්‍යාලයේදී ය.

### උපලේඛනය

## අනුමත කරනලද අරක්කු තැබෑරුම්—නුවරඑළිය දිස්ත්‍රික්කය—1969–70

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව පෙ.ව. | තැබෑරුම වසන වේලාව ප.ව. | ටෙන්ඩර් වසන වේලාව පෙ.ව. |
|---|---|---|---|---|---|
| 1 | කොත්මලේ | රම්බොඩ නගරය තුල | 8.00 | 6.30 | 9.30 |
| 2 | උඩහේවාහැට | පදියපැලැල්ල නගරය තුල | 8.00 | 7.00 | 10.00 |
| 3 | නුවරඑළිය | හෝල්බෲක් නගරය තුල | 8.00 | 6.30 | 10.30 |
| 4 | නුවරඑළිය නාගරික සභාවේ බඹරකැලේ | නුවරඑළිය නාගරික සභාවේ කොට්ඨාශ අංක 1, බඹරකැලේ | 8.00 | 7.30 | 11.00 |
| 5 | වලපනේ | රාගල නගරය තුල | 8.00 | 7.30 | 11.30 |

**සංලක්ෂ්‍යය.**—1969–70 කාල පරිච්ඡෙදය සඳහා දනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානයන්ම ලබාගත හැකිවේ යැයි පොරොන්දු නොවන අතර තැබෑරුම් පිහිටුවන ස්ථානයන් සඳහා නුවරඑළිය දිසාපතිගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

7–164—69.7.4.දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

---

## වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

### වෙන්දේසියේ විකිණීමයි

**වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැලඹ විල්ලි හත්පත්තුවේ, ගන්දාහේ කෝරළේ, රඹත්ත නමැති ගමේ පිහිටි අක්කර එකක ප්‍රමාණයෙන් යුත් රජවත්ත නමැති ඉඩමේ අංක 1 දරණ බිම් කැබැල්ල සහ එහි පිහිටි ගොඩනැගිල්ල යන වටිනා ඉඩ්පොළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.**

ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 62(1) දරණ වගන්තිය යටතේ ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද විශේෂ තීරණයක් විධිමත්ව ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීමෙන්, ඒ යටතේ ලැබී ඇති බලතල අනුව සහ එකී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් බලය ලත් පරිදි,

ආර්. ඊ. ද එස්. ජයසුන්දර ප්‍රසිද්ධ නොතාරිස්තැන විසින් 1960 ජනවාරි 26 වෙනි දින සහතික කරන ලද අංක 3472 දරණ උකස්කරය පිට මාවතගම, ජයන්ති ස්ටෝර්ස් හි පදිංචි බමුණුගම කෝරාලලාගේ ජයතිලක මහතා විසින් මෙම බැංකුවට ඇප වශයෙන් තබා ඇති, වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැලඹ විල්ලි හත්පත්තුවේ, ගන්දහේ කෝරළේ, රඹත්ත නමැති ගමේ පිහිටි, රජවත්ත නැමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ජී. බී. වික්‍රමරත්න මහතා විසින් 1932 ජූලි 6 වෙනි දින සාදන ලද අංක 480 දරණ මිනුම් සැලැස්මේ සඳහන් කර ඇති අක්කරයක (අ. 1, රූ. 0, ප. 0) ප්‍රමාණයෙන් යුත් අංක 1 දරණ බිම් කැබැල්ල සහ එහි පිහිටි ගොඩනැගිල්ල ඇතුළු සියළු දේ, ඉහතකී උකස්කරය පිට අය විය යුතුව ඇති රු. 20,719.53 ක මුදල සමග, රු. 18,505.67 කට අවුරුද්දකට සියයට 5½ බැගින් පොළිය සහ රු. 179.16 කට අවුරුද්දකට සියයට 4½ බැගින් 1965 ජූනි 19 වෙනි දින සිට වෙන්දේසිය සිදු කරන දින දක්වා අමතර පොළියද අයකර ගනු සඳහාත්, ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 63 වෙනි වගන්තිය යටතේ වියහියදම් සහ අය කර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහාත්, 1969 අගෝස්තු 30 වෙනි ශනි දින පස්වරු 3 ට එය පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වැඩි විස්තර කොළඹ, හෝටන් පෙදෙසේ, අංක 91 දරණ තැන පිහිටි ලංකා රජයේ උකස් බැංකුවෙන් ලබා ගත හැක.

ඩබ්ලිව්. එල්. මොරිස් ප්‍රනාන්දු,
බලයලත් වෙන්දේසිකරු.

" වෙල් විව් ",
කුරුණෑගල, 23.6.1969.

7–115—69.7.4 දින අංක 14,861 දරන ගැසට් පත්‍රය

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන
# සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දින වලට පෙරදින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමඟම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන් කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට **පැමිණෙන** සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිතැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. **68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලතදී එක කොටසක් ... ... ... | 0 | 50 | ... | 0 | 20 |
| ii ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | | 0 | 20 |
| (ආ) i ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 30 | .. | 0 | 15 |
| ii ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 | 60 | ... | 0 | 15 |

**දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි ... | **69. 6. 6 සිකුරාද** ... | **69. 5.30 සිකුරාද** | දවල් | 12.00 |
| | **69. 6.13 සිකුරාද** ... | **69. 6. 6 සිකුරාද** | දවල් | 12.00 |
| | **69. 6.20 සිකුරාද** ... | **69. 6.13 සිකුරාද** | දවල් | 12.00 |
| | **69. 6.27 සිකුරාද** ... | **69. 6.20 සිකුරාද** | ප.ව. | 3.30 |
| ජූලි ... | 69. 7. 4 සිකුරාද ... | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.11 සිකුරාද ... | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.18 සිකුරාද ... | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.25 සිකුරාද ... | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු ... | 69. 8. 1 සිකුරාද ... | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8. 8 සිකුරාද ... | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.15 සිකුරාද ... | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.22 සිකුරාද ... | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.29 සිකුරාද ... | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් ... | 69. 9. 5 සිකුරාද ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.12 සිකුරාද ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.19 සිකුරාද ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.26 සිකුරාද ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් ... | 69.10. 2 බ්‍රහස්පතින්ද ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.17 සිකුරාද ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.24 සිකුරාද ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | 69.10.31 සිකුරාද ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් ... | 69.11. 7 සිකුරාද ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | 69.11.14 සිකුරාද ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.11.21 සිකුරාද ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.11.28 සිකුරාද ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් ... | 69.12. 5 සිකුරාද ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.12 සිකුරාද ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 69.12.19 සිකුරාද ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.26 සිකුරාද ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
වැඩ බලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**1969 ජූනි මස 13 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**